# 4

# මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

## 4.1 සමස්ත නිරීක්ෂණ

**උද්ධමනය 2013 වසරේ දී පස්වැනි අනුයාත වසරටත් තනි ඉලක්කමක මට්ටමෙහි පැවති අතර, එය වසර තුළ තවදුරටත් පහළ යමින් 2013 දෙසැම්බර් මාසයේ දී හිතකර තනි මැදි ඉලක්කමක මට්ටමට ළඟා විය.** පසුගිය දශක හතරක කාලය තුළ උද්ධමනය අඛණ්ඩව තනි ඉලක්කමක මට්ටමෙහි පැවතුණු දීර්ඝතම කාල පරිච්ඡේදය මෙය වේ. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/07=100) මගින් මනිනු ලබන වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය වසරේ මුල් මාස කිහිපය තුළ සාපේක්ෂව ඉහළ අගයක් ගත් නමුත් 2013 ජුනි මාසයේ සිට පහළ වැටෙමින් 2013 දෙසැම්බර් මාසයේ දී සියයට 6.9 දක්වා ළඟා විය. දේශීය කෘෂි නිෂ්පාදනවල සැපයුම් තත්ත්වයන්ගේ සිදු වූ වර්ධනයත්, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි සමහර භාණ්ඩ මිල ගණන් පහළ යාමත්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් විචක්ෂණශීලී ලෙස ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් හේතුවෙන් ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය ද 2013 මාර්තු මාසයේ සිට අඩු වන ප්‍රවණතාවක් දැක්වීය. කෙසේ වුවද, ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ ආශ්‍රිතව පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතු කොට ගෙන සැපයුමට සිදු වූ බාධාවන්, ගෑස් හා ඉන්ධන මිල ඉහළ නැංවීම සහ 2012 වසරෙහි මුල් කාලයේ දී උද්ධමනය පහළ මට්ටමක පැවැතීම 2013 වසරේ මුල් මාස දෙක තුළ උද්ධමනය ඉහළ තනි ඉලක්කමක මට්ටමෙහි පැවතීමට හේතු විය. 2013 අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වන පරිදි විදුලිය ගාස්තු ඉහළ නංවමින් සිදු කළ ගැලපුම් සහ සමහර ආහාර ද්‍රව්‍ය මත වන ආනයන බදු ඉහළ නැංවීමේ සංශෝධන වසර තුළ උද්ධමනය මත කිසියම් බරක් ඇති කළේය. මේ අතර, උද්ධමනයෙහි දිගු කාලීන යටිදැරි උපනතිය නිරූපණය කෙරෙන මූලික උද්ධමනය, වාර්ෂික සාමාන්‍ය පදනම මත, 2013 ජුනි මස සිට අඛණ්ඩව පහළ ගියේය. ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තිවල සඵලදායී බව පෙන්නුම් කරමින් 2013 මාර්තු මස සිට පහළ වැටුණු ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ද, 2013 දෙසැම්බර් මාසය වන විට, සියයට 2.1 ක් කරා ළඟා විය. මෙය 2007 වසරේ දී එය හඳුන්වා දීමෙන් පසු වාර්තා කළ අඩුතම අගයයි.

**රාජ්‍ය සහ පෞද්ගලික යන දෙ අංශයෙහිම සේවකයන්ගේ නාමික වැටුප් 2013 වසරේ දී ඉහළ ගිය අතර, අවිධිමත් පෞද්ගලික අංශය විශාලතම වැටුප් වැඩිවීම වාර්තා කළේය.** 2013 අයවැය යෝජනාවලට අනුව 2013 ජනවාරි මස සිට රාජ්‍ය අංශයේ සේවකයන්ගේ (මධ්‍යම රජයේ විධායක නොවන නිලධාරීන්, සුළු සේවකයන් සහ රජයේ පාසල් ගුරුවරුන්ගේ) ජීවන වියදම් දීමනාව සහ විශ්‍රාම වැටුපට හිමිකම් නොමැති දීමනාව ඉහළ නංවමින් කළ ගැලපීම් එම සේවකයන්ගේ නාමික වැටුප් ඉහළ යාමට හේතු විය. පඩි පාලක සභාවල නියාමනයන් මගින් වැටුප් පාලනය වන, අවම වැටුප් ප්‍රමාණ දර්ශක මගින් මිනුම් කරනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ සමස්ත නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය 2013 වසරේ දී සියයට 5.7 කින් ඉහළ ගියේය.

මෙම ඉහළ යාම සඳහා මුළුමනින්ම හේතු වූයේ 2013 වසරේ දී කර්මාන්ත හා වාණිජ සහ සේවා අංශයන්හි සේවකයන්ගේ අවම වැටුප් පිළිවෙළින් සියයට 32.9 කින් සහ සියයට 21.0 කින් තීව්‍ර ලෙස ඉහළ නැංවීමය. මේ අතර, 2013 වසරේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් විසින් සියයට 3.1 ක මූර්ත වැටුප් ඉහළ යාමක් භුක්තිවිඳින ලදී. විධිමත් පෞද්ගලික අංශයෙහි කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශ සැලකිය යුතු මූර්ත වැටුප් ඉහළ යාම් වාර්තා කළේය. කෙසේ වුවද, 2013 වසරේ දී සමස්ත දර්ශකයෙහි විශාලතම බර තැබීම දරන කෘෂිකර්මාන්ත අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්වල තරමක පහළ යාමක් සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2013 වසරේ දී විධිමත් පෞද්ගලික අංශයේ සමස්ත මූර්ත වැටුප් පෙර වසරට සාපේක්ෂව සියයට 1.2 කින් සුළු වශයෙන් පහළ වැටිණි. සමස්තයක් වශයෙන් නාමික වැටුප් අනුපාතයන්හි සැලකිය යුතු ඉහළ නැංවීමකින් තොරව මූර්ත වැටුප් ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට අඩු උද්ධමනකාරී පරිසරය දායක විය. මෙය, වැටුප්-උද්ධමන දඟරයන් ඇතිවීම වැළැක්වීමට සහ ආර්ථිකයේ තරගකාරිත්වය පවත්වා ගැනීමට දායක වන හිතකර වර්ධනයකි.

**ශ්‍රම වෙළෙඳපොළෙහි සාධනීය ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින්, 2013 වසරේ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පසුගිය වසර කිහිපය තුළ දක්නට ලැබුණු පහළ යාමේ උපනතියට ප්‍රතිවිරුද්ධව යමින් ඉහළ ගියේය.** ග්‍රාමීය අංශයේ කාන්තාවන් ශ්‍රම බලකායට ඇතුළත් වීම ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය. නව රැකියා අවස්ථා බලාපොරොත්තුවන්නන් ශ්‍රම වෙළෙඳපොළට ඇතුළු වීමත් සමඟ 2012 වසරේ දී සියයට 4.0 ක් වූ සේවා වියුක්ති අනුපාතිකය 2013 වසරේ දී සියයට 4.4 දක්වා ඉහළ ගියේය. පෞද්ගලික අංශය 2012 වසරේ දී මෙන්ම 2013 වසරේ දී ද සමස්ත සේවා නියුක්තිය සඳහා විශාලතම දායකත්වය සැපයූ අතර, ඉන්පසු ස්වයං රැකියා අංශය සහ රාජ්‍ය අංශය දායක විය. සමස්ත සේවා නියුක්තිය කෙරෙහි සේවා සහ කර්මාන්ත අංශ සැලකිය යුතු ලෙස දායක වූ අතර, මේ සඳහා වසර තුළ අත්විඳින ලද ඉහළ වර්ධන වේගය උපකාරී විය. කෘෂිකර්මාන්ත අංශයෙහි ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීමට හේතු වන එම අංශයේ සේවා නියුක්තිය අඩු වීම යහපත් වර්ධනයකි. 2013 වසරේ දී සේවා අංශයෙහි නිෂ්පාදිතය ඉහළ ගිය ද, එම අංශයට නව සේවකයන් පිවිසීමේ ප්‍රතිඵලයක් ලෙස එහි ශ්‍රම ඵලදායිතාව පහළ ගියේය. සමස්ත ආර්ථිකයෙහි ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීම කෙරෙහි ප්‍රමුඛ දායකයා වූයේ කර්මාන්ත අංශයයි.

**සේවා වියුක්තිය මත පීඩනය අඩු කරමින් සහ රට තුළට විදේශ විනිමය ගලා ඒම පුළුල් කරමින් විදේශ සේවා නියුක්තිය සඳහා පිටත්ව යාම් අඛණ්ඩව ඉහළ ගියේය.** විදේශ විනිමය ඉපැයීම සඳහා ගෘහ සේවිකාවන් මත යැපීම අවම කිරීමට බලධාරීන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්හි සාධනීය බව පිළිබිඹු කරමින් විදේශ රැකියා සඳහා ගෘහ සේවිකාවන් ලෙස පිටත්ව යන්නන්ගේ සැලකිය යුතු පහළ යාමක් වසර තුළ දී දැකිය හැකි විය. එක් සේවකයකුට වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් ඉපැයීමට හැකි වීම සහ රට වෙත දැනුම හා තාක්ෂණය ගලා ඒමේ මං විවර වීම වැනි වාසිදායක අවස්ථා බිහි වීම හේතුවෙන් වෘත්තීයවේදීන්, මධ්‍යම මට්ටමේ සේවකයන් සහ ලිපිකරු ආදී වඩාත් පුහුණු කාණ්ඩවල රැකියා සඳහා පිටත්ව යාම් සංඛ්‍යාව ඉහළ යාම, බලාපොරොත්තු තැබිය හැකි යහපත් නැඹුරුවකි. විශේෂයෙන්ම, දීර්ඝ කාලීනව ලැබිය හැකි සමාජයීය සහ ආර්ථික ප්‍රතිලාභ පිළිබඳව සලකා බැලීමේ දී විදේශ සේවා නියුක්තියෙහි දක්නට ලැබෙන මෙම වර්ධනය වඩාත් වාසිදායක වනු ඇත.


## 4.2 මිල

### මිල විචලනයන් සහ දායක වූ සාධක

#### කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.)

**2013 වසරේ දී පාරිභෝගික මිල උද්ධමනය පහළ බැසීමේ උපනතියක් නිරූපණය කළේය.** ශ්‍රී ලංකාවේ පාරිභෝගික මිල විචලනයන් මිනුම් කරනු ලබන නිල මිල දර්ශකය වන කො.පා.මි. දර්ශකය (2006/07=100), 2012 දෙසැම්බර් මස පැවති 168.6 හි සිට 2013 දෙසැම්බර් මාසයේ දී සියයට 4.7 ක ලක්ෂ්‍යමය උද්ධමනයක් පිළිබිඹු කරමින් 176.5 දක්වා ඉහළ ගියේය. එය 2012 දෙසැම්බර් මස පැවති සියයට 9.2 හි සිට සිදු

**4.1 රූප සටහන** **කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (2006/07=100)**



**4.1 සංඛ්‍යා සටහන**

**මිල දර්ශකවල වෙනස්වීම්**

| දර්ශකය | දර්ශකය (වසර අග) | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 (අ) | 2012 දෙසැ./ 2011 දෙසැ. | 2013 දෙසැ./ 2012 දෙසැ. (අ) | 2012/2011 | 2013/2012 (අ) |
| කො.පා.මි.ද. (2006/07=100) | 168.6 | 176.5 | 9.2 | 4.7 | 7.6 | 6.9 |
| ද.දේ.නි. අවධමනකය (2002=100) | 248.9 (ආ) | 265.6 | - | - | 8.9 | 6.7 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වූ තියුණු පහළ යාමකි. ලක්ෂ්‍යමය උද්ධමනය වසර පහකට ආසන්න කාලයක් මුළුල්ලේ අඛණ්ඩව තනි ඉලක්කමක මට්ටමෙහි පැවති අතර, එය 1977 දී විවෘත ආර්ථිකයකට පිවිසීමෙන් පසු එවැනි තත්ත්වයක් වාර්තා කළ දීර්ඝතම කාල පරිච්ඡේදය වේ. කෙසේ වුවද, වසරේ මුල් කාලය තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ආහාර සැපයුමට බාධා සිදුවීම 2013 ජනවාරි සහ පෙබරවාරි මාසවල දී උද්ධමනය සියයට 9.8 කරා ළඟා වීමට හේතු විය. ඍතුමය අස්වැන්න වෙළෙඳපොළට පැමිණීමත් සමඟ මිල ගණන් ක්‍රමයෙන් පහළ වැටුණු අතර, 2013 දෙසැම්බර් මාසයේ දී ලක්ෂ්‍යමය උද්ධමනය එහි අවම මට්ටම කරා ළඟා විය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ද එයට සමාන උපනතියක් දක්වමින් 2012 වසර අවසානයේ පැවති සියයට 7.6 සමඟ සසඳන විට 2013 වසර අග දී සියයට 6.9 දක්වා පහළ වැටිණි. මෙම සතුටුදායක නැඹුරුව දේශීය සැපයුම් තත්ත්වයන් වැඩිදියුණු වීම, ජාත්‍යන්තර වෙළෙඳපොළේ භාණ්ඩ මිල ගණන් පහළ යාම සහ විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්තියෙහි සංයුක්ත ප්‍රතිඵලයකි.

**කො.පා.මි. දර්ශකයෙහි සියයට 41.0 ක බරතැබීමක් දරන ආහාර කාණ්ඩයෙහි උද්ධමනය ඉහළ යාමට වඩා ආහාර නොවන කාණ්ඩයෙහි උද්ධමනය පහළ යාම වඩාත් ප්‍රබල විය.** ඒ අනුව, ආහාර නොවන කාණ්ඩය 2013 වසරේ උද්ධමනය පහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. කො.පා.මි. දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වෙනස කෙරෙහි ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 2012 වසරේ වූ සියයට 70.7 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 48.0 ක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ආහාර නොවන කාණ්ඩයේ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2012 වසරේ පැවති සියයට 10.0 සමඟ සසඳන විට 2013 වසරේ දී සියයට 6.1 දක්වා අඩු විය.

**කො.පා.මි. දර්ශකයේ සමස්ත බර තැබුමෙන් සියයට 12.3 ක් වන ප්‍රවාහන උප දර්ශකය 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ දී වාර්ෂික සාමාන්‍ය පදනම මත සැලකිය යුතු පහළ යාමක් වාර්තා කළේය.** 2013 වසර තුළ ඉන්ධන මිල ගණන් සහ බස් ගාස්තු ඉහළ යාම ඉතා සුළු ප්‍රමාණයකින් සිදු වීම හේතුවෙන් 2012 වසරේ දී වූ සියයට 21.6 ක ඉහළ යාම සමඟ සැසඳීමේ දී මෙම කාණ්ඩය 2013 වසරේ දී සියයට 4.6 කින් පමණක් ඉහළ ගියේය.

**විදුලිය ගාස්තු ඉහළ නංවමින් කළ ගැලපුම් හේතුවෙන් ඇති වූ පීඩනය වසර තුළ දී සාර්ථකව පාලනය කර ගැනිණි.** 2013 අප්‍රේල් මාසයේ දී විදුලිය ගාස්තු ඉහළ නංවමින් සිදු කළ සංශෝධන කො.පා.මි. දර්ශකය මත ඍජු සහ වක්‍ර යන දෙ ආකාරයෙන්ම පීඩනයක් ඇති කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන උප දර්ශකය වාර්ෂික සාමාන්‍ය උද්ධමනය කෙරෙහි 2012 වසරේ වූ සියයට 24.9 ක දායකත්වය සමඟ සසඳන විට 2013 වසරේ දී සියයට 30.8 කින් දායක විය. මෙම උප දර්ශකය 2013 වසරේ උද්ධමනයෙහි ඉහළ යාම සඳහා ආහාර නොවන කාණ්ඩය තුළ ප්‍රධාන දායකයත්වය දැක්වීය. විදුලිය ගාස්තු ඉහළ යාමෙහි වක්‍ර බලපෑම ප්‍රධාන වශයෙන්, සකස් කළ ආහාර උප කාණ්ඩය සහ විනෝදාත්මක හා සංස්කෘතික උප දර්ශකය සඳහා වූ වියදම් ඉහළ යාම තුළින් පිළිබිඹු විය.

**උද්ධමනය මත එල්.පී. ගෑස් සහ ඉන්ධන මිල සංශෝධනයන්ගේ බලපෑම 2012 වසරට වඩා අඩු විය.** 2013 ජනවාරි මාසයේ දී කිලෝ ග්‍රෑම් 12.5 ක් බරැති ලිට්‍රෝ සහ ලාෆ් යන දෙවර්ගයේම එල්.පී. ගෑස් මිල රුපියල් 150 කින් ඉහළ නැංවිණි. බොර තෙල්වල ආනයනික මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සමුච්චිත අලාභ, 2013 වසරේ දී පෙට්‍රල් සහ ඩීසල් මිල ගණන් පිළිවෙළින් ලීටරයකට රුපියල් 3 සහ රුපියල් 6 බැගින් ඉහළ නැංවීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඒවායේ සාමාන්‍ය මිල ගණන් පිළිවෙළින් සියයට 1.9 කින් සහ සියයට 5.2 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, 2012 වසරේ දී පෙට්‍රල් සහ ඩීසල් මිල ගණන්වල පිළිවෙළින් සියයට 6.7 කින් සහ සියයට 36.9 කින් සිදු වූ ඉහළ යාම සමඟ සසඳන විට 2013 වසරේ දී එම අයිතමයන් දෙකෙහි සාමාන්‍ය මිල ඉහළ යාම පහළ මට්ටමක පැවතිණි.

**4.2 සංඛ්‍යා සටහන**

**උප කාණ්ඩ අනුව වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සඳහා දායකත්වය (අ)**

| දර්ශකය | 2012 ප්‍රතිශතය | | 2013 ප්‍රතිශතය | |
|---|---|---|---|---|
| | වෙනස | දායකත්වය | වෙනස | දායකත්වය |
| **කො.පා.මි.ද. (සියලුම ශීර්ෂ)** | **7.6** | **100.0** | **6.9** | **100.0** |
| **ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග** | **4.7** | **29.3** | **7.9** | **52.0** |
| **ආහාර නොවන** | **10.0** | **70.7** | **6.1** | **48.0** |
| රෙදිපිළි සහ පාවහන් | 9.8 | 4.0 | 5.4 | 2.4 |
| නිවාස, ජලය, විදුලි, ගෑස් සහ වෙනත් ඉන්ධන | 9.6 | 24.9 | 10.7 | 30.8 |
| ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ සහ ගෘහ ඒකක නඩත්තුව | 6.7 | 2.8 | 4.0 | 1.8 |
| සෞඛ්‍යය | 3.0 | 2.0 | 1.7 | 1.2 |
| ප්‍රවාහන | 21.6 | 34.7 | 4.6 | 9.1 |
| සන්නිවේදන | 0.0 | 0.0 | 0.0 | 0.0 |
| විනෝදාත්මක හා සංස්කෘතික | 4.0 | 0.7 | 4.1 | 0.8 |
| අධ්‍යාපන | 0.5 | 0.2 | 0.9 | 0.5 |
| විවිධ භාණ්ඩ හා සේවා | 4.1 | 1.3 | 4.2 | 1.5 |

(අ) කො.පා.මි.ද. (2006/07=100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**ආහාර නොවන කාණ්ඩයේ අනෙකුත් සමහර භාණ්ඩවල උද්ධමනය පහළ යාම 2013 වසරේ දී සමස්ත උද්ධමනය පාලනය කිරීම කෙරෙහි හිතකර ලෙස දායක විය.** වසර තුළ සමස්ත උද්ධමනය අඩු කිරීමට දායක වෙමින් රෙදිපිළි හා පාවහන්; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තු; සහ සෞඛ්‍ය යන උප දර්ශකයන්ගේ මිල ගණන් වැඩි වීමේ වේගය 2013 වසරේ දී පහත වැටිණි. මීට පෙර වසරේ දී මෙන්ම සන්නිවේදන උප දර්ශකයේ අයිතමයන්ගේ මිල ගණන් සමස්තයක් වශයෙන් 2013 වසරේ දී ද නොවෙනස්ව පැවතිණි.

**2013 වසරේ සමස්ත උද්ධමනය වැඩි වීම කෙරෙහි ආහාර කාණ්ඩයේ මිල ගණන් ඉහළ යාම විශාල වශයෙන් දායක විය.** ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් උප දර්ශකය 2012 වසරේ දැක් වූ සියයට 4.7 ක ඉහළ යාමට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 7.9 කින් ඉහළ ගියේය. මෙම ඉහළ යාම, 2013 වසරේ දී කො.පා.මි. දර්ශකයේ සමස්ත ඉහළ යාම කෙරෙහි සියයට 52.0 ක දායකත්වයක් සැපයීය. 2012 වසරේ දී එම උප දර්ශකය දැක්වූ දායකත්වය සියයට 29.3 කි. ආහාර කාණ්ඩය තුළ සහල්, එළවළු, පළතුරු, මස්, පොල් සහ ආහාර පිසීමට යොදා ගන්නා තෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් 2013 වසරේ දී සාපේක්ෂව වැඩි වේගයකින් ඉහළ නැගිණි. අහිතකර කාලගුණික තත්ත්වයන් නිසා දේශීය සැපයුමට සිදු වූ බාධාවන් හේතුවෙන් මිල ගණන්වල ඉහළ යාම වසරේ පළමු භාගය තුළ දී වඩාත් තීව්‍ර විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වාර්ෂික සාමාන්‍ය ආහාර උද්ධමනය 2013 ජනවාරි මාසයේ පැවති සියයට 5.7 හි සිට මැයි මාසයේ දී උච්චතම අගය වූ සියයට 9.7 දක්වා ළඟා වූ අතර, ජුනි මාසයේ දී ද එම මට්ටමෙහි ම පැවතිණි. ආහාර උද්ධමනය වසරේ අවසන් භාගයේ දී පහළ ගිය අතර, 2013 දෙසැම්බර් මාසයේ දී සියයට 7.9 කට ළඟා විය. මෙයට ප්‍රතිවිරුද්ධව, උද්ධමනය මත පීඩනය අවම කරමින් නැවුම් මත්ස්‍ය හා මුහුදු ආහාර, කිරි පිටි සහ සීනි මිල ගණන් 2012 වසර සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී අඩු වේගයකින් ඉහළ ගියේය.

**2012 වසරට සාපේක්ෂව 2013 වසරේ දී සහල්වල සාමාන්‍ය මිල ගණන් ඉහළ මට්ටමක පැවතිණි.** 2012 වසරේ යල කන්නයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ලද, වාර්තා ගත අඩු වී අස්වැන්න සහ සැපයුම් හිඟතාවන් නිසා 2013 වසරේ මුල් කාල සීමාව තුළ සහල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතිණි. 2013 වසරේ මහ කන්නයේ අස්වනු ලැබීමත්, වඩා සරු යල කන්නයේ අස්වැන්නක් ලැබීමත් සමඟ වසරේ පසු කාලීනව සහල් මිල ගණන්වල ක්‍රමික පහළ යාමක් දැකිය හැකි විය. කෙසේ වුවද, සහල් මිලෙහි සිදු වූ මෙම සතුටුදායක වර්ධනයන් 2012 වසරේ දක්නට ලැබුණු පහළ සාමාන්‍ය මිල ගණන් මගින් ඇති කළ බලපෑම අභිබවා යාමට තරම් ප්‍රමාණවත් නොවිණි. එහෙත්, 2013 වසරේ සමස්ත සහල් මිල ඉහළ යාමේ වේගය සමනය කිරීමට එය ප්‍රමාණවත් විය. 2013 අයවැය යෝජනාවලට අනුව රජය මගින් වී මිල දී ගැනීමේ සහතික මිල ඉහළ නැංවීම සහල් මිල ඉහළ යාම කෙරෙහි තවදුරටත් හේතු විය.

**එළවළුවල සාමාන්‍ය මිල 2013 වසර අවසාන වනවිට ක්‍රමයෙන් පහළ ගිය ද 2012 වසර සමඟ සැසඳීමේ දී එම මිල වැඩි වේගයකින් ඉහළ ගියේය.** අධික වර්ෂාපතනය සහ ගංවතුර හේතුවෙන් මහ කන්නය ආරම්භ කිරීම පමා වීම 2013 මුල් මාස කිහිපය

**4.3 සංඛ්‍යා සටහන**

**ආනයනික සහ දේශීයව නිෂ්පාදිත ප්‍රධාන අයිතමයන්ගේ සිල්ලර මිල ගණන්**

| අයිතමය | ඒකකය | කො.පා.මි.ද. (2006/07=100) භරිත % | මිල රුපියල් | | | | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | වාර්ෂික සාමාන්‍යය | | | 2011 දෙසැ. | 2012 දෙසැ. | 2013 දෙසැ. | වාර්ෂික සාමාන්‍ය | | ලක්ෂ්‍යමය | |
| | | | 2011 | 2012 | 2013 | | | | 2012/ 2011 | 2013/ 2012 | 2012 දෙසැ./ 2011 දෙසැ. | 2013 දෙසැ./ 2012 දෙසැ. |
| **දේශීය** | | | | | | | | | | | | |
| සම්බා සහල් | කි.ග්‍රෑ.1ක් | 1.96 | 68.38 | 70.15 | 72.29 | 68.19 | 74.06 | 72.21 | 2.6 | 3.1 | 8.6 | -2.5 |
| රතු කැකුළු සහල් | ,, | 0.85 | 57.27 | 57.08 | 59.87 | 56.80 | 60.58 | 60.78 | -0.3 | 4.9 | 6.7 | 0.3 |
| සුදු කැකුළු සහල් | ,, | 0.60 | 56.58 | 56.26 | 59.28 | 56.33 | 60.46 | 60.44 | -0.6 | 5.4 | 7.3 | 0.0 |
| නාඩු සහල් | ,, | 0.35 | 59.25 | 59.67 | 61.59 | 58.95 | 62.73 | 63.31 | 0.7 | 3.2 | 6.4 | 0.9 |
| පොල් (මධ්‍යම ප්‍රමාණය) | ගෙඩියක් | 1.84 | 41.01 | 34.76 | 43.44 | 33.78 | 38.22 | 47.64 | -15.2 | 25.0 | 13.1 | 24.7 |
| මාළු (කෙළවල්ලා) | කි.ග්‍රෑ.1ක් | 1.11 | 632.32 | 694.14 | 697.33 | 652.30 | 718.18 | 694.60 | 9.8 | 0.5 | 10.1 | -3.3 |
| බෝංචි | ,, | 0.43 | 167.34 | 157.60 | 166.00 | 175.07 | 160.65 | 166.16 | -5.8 | 5.3 | -8.2 | 3.4 |
| වම්බටු | ,, | 0.19 | 90.84 | 99.25 | 107.73 | 87.31 | 113.28 | 92.58 | 9.3 | 8.5 | 29.7 | -18.3 |
| බිත්තර | එකක් | 0.37 | 11.64 | 11.29 | 14.06 | 9.67 | 14.49 | 14.12 | -3.0 | 24.5 | 49.8 | -2.5 |
| **ආනයනික** | | | | | | | | | | | | |
| සීනි | කි.ග්‍රෑ.1ක් | 1.12 | 96.11 | 101.04 | 100.95 | 92.91 | 105.50 | 102.41 | 5.1 | -0.1 | 13.6 | -2.9 |
| කිරිපිටි - ඇන්කර් | ග්‍රෑ.400ක් | 3.21 | 255.92 | 302.35 | 325.00 | 264.00 | 325.00 | 325.00 | 18.1 | 7.5 | 23.1 | 0.0 |
| රතු පරිප්පු | කි.ග්‍රෑ.1ක් | 0.73 | 149.20 | 145.07 | 156.34 | 131.95 | 146.18 | 157.05 | -2.8 | 7.8 | 10.8 | 7.4 |
| තිරිඟු පිටි | ,, | 0.20 | 83.92 | 90.92 | 98.13 | 84.07 | 98.46 | 97.93 | 8.3 | 7.9 | 17.1 | -0.5 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

තුළ එළවළු මිල ගණන් වඩා තියුණු ලෙස ඉහළ යාමට හේතු විය. කෙසේ වුවද, වෙළෙඳපොළට යල කන්නයේ අස්වනු නිකුත් වීමත් සමග එළවළු මිල මත වූ පීඩනය ක්‍රමයෙන් අඩු විය. නමුත් මෙම මිල පහළ යාම, වසරේ මුල් මාස කිහිපය තුළ සිදු වූ මිල ගණන් ඉහළ යාම ඉක්මවූ හෙයින්, එළවළු උප කාණ්ඩයේ බර තැබූ සාමාන්‍ය මිල ගණන් 2013 වසරේ දී සියයට 12.5 කින් ඉහළ ගියේය. මේ අතර, පොල් හා පොල් තෙල්වල මිල ගණන් ද 2013 වසරේ දී සැලකිය යුතු වේගයකින් ඉහළ නැගිණි. මෙය 2012 වසරේ පැවති දරුණු නියං තත්ත්වයෙහි කාල පමාවකින් යුතු බලපෑමෙහි ප්‍රතිඵලයකි. 2013 වසරේ දී ලද අඩු අස්වැන්න සහ 2012 වසරේ වාර්තා වූ අඩු මිල ගණන් 2013 වසරේ දී ළූණු සහ අර්තාපල් මිල ගණන් වැඩි වේගයකින් ඉහළ නැංවීමට හේතු විය.

**පෙර වසර සමග සසඳන විට 2013 වසරේ දී නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාරවල සාමාන්‍ය මිල ගණන් අඩු වේගයකින් ඉහළ ගියේය.** පෙබරවාරි සිට අප්‍රේල් සහ ජූලි සිට දෙසැම්බර් යන කාල පරිච්ඡේදවල දී සෘතුමය සැපයුම ඉහළ යාම සහ බහු දින යාත්‍රා මගින් ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම නිසා නිෂ්පාදනය ඉහළ යාම හේතුවෙන් නැවුම් මත්ස්‍ය මිල ගණන්හි සාමාන්‍යය පහළ ගියේය. කෙසේ වුවද, වෙරළබඩ ප්‍රදේශයන්හි පැවති අධික වර්ෂාව හේතුවෙන් සැපයුම අඩු වීම නිසා මැයි සිට ජූලි දක්වා කාලය තුළ මිල ගණන්වල සැලකිය යුතු ඉහළ යාමක් වාර්තා විය. වසරේ මුල් භාගය තුළ කරවල සාමාන්‍ය මිල ගණන් ඉහළ මට්ටමක පැවතිය ද, වසරේ අවසන් භාගයේ දී මෙම මිල ගණන් සුළු වශයෙන් පහත වැටිණි. වෙළෙඳපොළෙහි දේශීය හාල්මැස්සන් සැපයුම පහළ යාම නිසා ඒවායේ සාමාන්‍ය මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාම කරවල මිල ගණන්හි සමස්ත ඉහළ යාම කෙරෙහි විශාල වශයෙන් බලපෑවේය. සත්ත්ව ආහාර සඳහා වන ඉහළ පිරිවැය හේතු කොට ගෙන වසරේ මුල් මාස කිහිපය තුළ කුකුළු මස් මිල ගණන් ඉහළ ගියේය. කුකුළු මස් මිලෙහි දක්නට ලැබුණු මෙම ඉහළ යාමේ උපනතිය වසරේ පසු කාලයේ දී අඩු වන නැඹුරුවක් පෙන්වමින් සියයට 6.0 ක වාර්ෂික සාමාන්‍ය ඉහළ යාමක් වාර්තා කළේය. 2013 අයවැය යෝජනා අනුව නිෂ්පාදනය ඉහල නැංවීම වෙනුවෙන් ගොවීන් වෙත පිරිවැය අඩු කිරීමේ දිරි දීමනා ලබාදීම මෙම මිල ගණන් අඩුවීම සඳහා හේතු විය. නිෂ්පාදන පිරිවැය ඉහළ යාම සහ ආදේශන බලපෑම් හේතුවෙන් බිත්තරවල සාමාන්‍ය මිල ගණන් ද වසර තුළ දී ඉහළ ගියේය.

**ජාත්‍යන්තර වෙළෙඳපොළ මිල වර්ධනයන්, විනිමය අනුපාත සහ දේශීය බදු ව්‍යුහයේ වෙනස් වීමට සමගාමීව ආනයනික භාණ්ඩවල දේශීය මිල ගණන් විචලනය විය.** ශ්‍රී ලංකා මහ බැංකු වෙළෙඳ දර්ශකවල ආහාර හා පාන උප කාණ්ඩයේ ආනයනික මිල ගණන් හි ඉහළ යාම 2012 වසරේ වූ සියයට 3.8 සමඟ සසඳන විට 2013 වසරේ දී සියයට 1.0 ක් විය. මෙම මිල ඉහළ යාම, කො.පා.මි. දර්ශකයට අයත් භාණ්ඩ පැසෙහි කිරි පිටි, පරිප්පු, ලොකු ළූණු සහ තිරිඟු පිටි මිල ගණන් මගින් ද පිළිබිඹු විය. දේශීය නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා සමහර ආනයනික ආහාර අයිතමයන් මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පැනවීම/ඉහළ නැංවීම හේතුවෙන් දේශීය වෙළෙඳපොළෙහි කිරි ආහාර, පාම් තෙල්, පොල් තෙල් සහ හාල්මැස්සන් ආදියෙහි

මිල ගණන් ඉහළ නැගිණි. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකු වෙළෙඳ දර්ශක මගින් දක්වන පරිදි අනෙකුත් පරිභෝජන භාණ්ඩවල ආනයනික මිල ගණන් 2012 වසරේ දී වූ සියයට 5.9 ක ඉහළ යාම සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී සියයට 1.2 කින් පමණක් ඉහළ ගියේය. කෙසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකු වෙළෙඳ දර්ශකවලට අනුව වෛද්‍ය හා ඖෂධ අයිතමයන්, ගෘහ භාණ්ඩ අයිතමයන් සහ රෙදිපිළි හා උපාංගවල ආනයනික මිල ගණන් වසර තුළ ඉහළ නැගිණි. මෙම මිල වෙනස්වීම් කො.පා.මි. දර්ශකයේ අදාළ උප කාණ්ඩවලින් ද පිළිබිඹු විය. මේ අතරතුර උද්ධමනය මත මුදල් අවප්‍රමාණය වීමේ බලපෑම අවම බව පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සුළු වශයෙන් උච්චාවචනය වෙමින්, වසර තුළ දී සියයට 2.7 කින් පමණක් අවප්‍රමාණය විය.

**මූලික උද්ධමනය 2013 වසරේ දී මන්දගාමී වෙමින් දෙසැම්බර් මාසයේ දී එහි අඩුතම අගය කරා ළඟා විය.** වාර්ෂික සාමාන්‍ය සහ ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2012 දෙසැම්බර් මස පිළිවෙළින් පැවති සියයට 5.8 සහ

**4.4 සංඛ්‍යා සටහන**

**පරිපාලිත මිල සංශෝධන (2011-2013)**

| අයිතමය | | ඒකකය | මිල (වසර අවසානයේ දී) රුපියල් | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | | 2011 | 2012 | 2013 | 2012/2011 | 2013/2012 |
| ඩීසල් - ලං. බ. නී. සං | | ලී. 1ක් | 84.00 | 115.00 | 121.00 | 36.9 | 5.2 |
| ඩීසල් - ලං. ඉ. තෙ. සං. | | ,, | 84.00 | 121.00 | 121.00 | 44.0 | 0.0 |
| භූමිතෙල් | | ,, | 71.00 | 106.00 | 106.00 | 49.3 | 0.0 |
| පෙට්‍රල් | | ,, | 137.00 | 159.00 | 162.00 | 16.1 | 1.9 |
| ගෑස් - ලිට්‍රෝ | | කි.ග්‍රෑ. 12.5 | 2,046.00 | 2,246.00 | 2,396.00 | 9.8 | 6.7 |
| ගෑස් - ලාෆ් | | කි.ග්‍රෑ. 12.5 | 2,046.00 | 2,246.00 | 2,396.00 | 9.8 | 6.7 |
| දැවිතෙල් (1000) | | ලී. 1ක් | 48.70 | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. | ලැ.නො. |
| දැවිතෙල් (1500) | | ,, | 50.00 | 90.00 | 90.00 | 80.0 | 0.0 |
| දැවිතෙල් (3500) | | ,, | 50.00 | 90.00 | 90.00 | 80.0 | 0.0 |
| විදුලිය ගාස්තු - ස්ථාවර | ඒකක පරාසය | | | | | | |
| | | 0-30 | 30.00 | 30.00 | 30.00 | 0.0 | 0.0 |
| | | 31-60 | 60.00 | 60.00 | 60.00 | 0.0 | 0.0 |
| | | 61-90 | 90.00 | 90.00 | 90.00 | 0.0 | 0.0 |
| | | 91-180 | 315.00 | 315.00 | 315.00 | 0.0 | 0.0 |
| | | 180 ට වැඩි | 315.00 | 315.00 | 420.00 | 0.0 | 33.3 |
| විදුලිය ගාස්තු - ඒකක | ඒකක පරාසය | | | | | | |
| | 60 ට අඩු | 0-30 | 3.00 | 3.00 | 3.00 | 0.0 | 0.0 |
| | | 31-60 | 4.70 | 4.70 | 4.70 | 0.0 | 0.0 |
| විදුලිය ගාස්තු - ඒකක | ඒකක පරාසය | | | | | | |
| | 60 ට වැඩි | 0-60 | - | - | 10.00 | - | - |
| | | 61-90 | 7.50 | 7.50 | 12.00 | 0.0 | 60.0 |
| | | 91-120 | 21.00 | 21.00 | 26.50 | 0.0 | 26.2 |
| | | 121-180 | 24.00 | 24.00 | 30.50 | 0.0 | 27.1 |
| | | 180 ට වැඩි | 36.00 | 36.00 | 42.00 | 0.0 | 16.7 |
| විදුලිය ගාස්තු - ඉන්ධන ගැලපුම් (අ) | ඒකක පරාසය | 0-30 | - | - | - | 25.0 | 25.0 |
| | | 31-60 | - | - | - | 35.0 | 35.0 |
| | | 61-90 | - | - | - | 40.0 | 10.0 |
| | | 90 ට වැඩි | - | - | - | 40.0 | 40.0 |
| ජල ගාස්තු - ඒකක | ඒකක පරාසය | 0-5 | 3.00 | 8.00 | 8.00 | 166.7 | 0.0 |
| | | 6-10 | 7.00 | 11.00 | 11.00 | 57.1 | 0.0 |
| | | 11-15 | 15.00 | 20.00 | 20.00 | 33.3 | 0.0 |
| | | 16-20 | 30.00 | 40.00 | 40.00 | 33.3 | 0.0 |
| | | 21-25 | 50.00 | 58.00 | 58.00 | 16.0 | 0.0 |
| | | 26-30 | 75.00 | 88.00 | 88.00 | 17.3 | 0.0 |
| | | 31-40 | 90.00 | 105.00 | 105.00 | 16.7 | 0.0 |
| | | 41-50 | 105.00 | 120.00 | 120.00 | 14.3 | 0.0 |
| | | 51-75 | 110.00 | 130.00 | 130.00 | 18.2 | 0.0 |
| | | 75 ට වැඩි | 120.00 | 140.00 | 140.00 | 16.7 | 0.0 |
| බස් ගාස්තු | | | | | | 20.0 | 7.0 |

(අ) 2012. 02. 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමස්ත මාසික විදුලි ගාස්තුව මත පමණක් ඉන්ධන ගැලපුම් ගාස්තුව නැවත පනවන ලදි. 2013. 04. 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි විදුලිය සඳහා වූ ස්ථාවර ගාස්තු, ඒකක ගාස්තු සහ ඉන්ධන ගැලපුම් ගාස්තු සංශෝධනය කරන ලදී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 7.6 හි සිට 2013 දෙසැම්බර් මාසයේ දී පිළිවෙළින් සියයට 4.4 සහ සියයට 2.1 දක්වා ළඟා විය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය ජනවාරි මස පැවති සියයට 6.1 හි සිට මැයි මාසයේ දී සියයට 6.6 දක්වා වසරේ මුල් කාලය තුළ සුළු වශයෙන් ඉහළ ගියේය. ඉන් අනතුරුව, එය තියුණු ලෙස පහළ වැටුණු අතර වසර අවසානයේ දී සියයට 4.4 දක්වා ළඟා විය. 2013 ජනවාරි මස පැවති සියයට 7.3 හි සිට පෙබරවාරි මාසයේ දී සියයට 7.4 දක්වා සුළු වශයෙන් ඉහළ නැගුණු ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ඉන්පසු වඩා වැඩි වේගයකින් පහළ බසිමින් 2007 වසරේ එය හඳුන්වා දීමෙන් පසු වාර්තා කළ අඩුතම අගය වූ සියයට 2.1 දක්වා දෙසැම්බර් මාසයේ දී පහළ වැටිණි. වසර මුළුල්ලේම, වාර්ෂික සාමාන්‍ය පදනම මත මතුපිට උද්ධමනයෙහි උපනතිය ප්‍රධාන වශයෙන් මූලික උද්ධමනයෙහි උපනතිය අනුගමනය කළේය. 2013 වසරේ මූලික උද්ධමනය පහළ යාම මගින් ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්තිවල සාධනීය බව සහ 2012 වසරේ දී අනුගමනය කළ දැඩි මුදල් ප්‍රතිපත්තීන්හි කාල පමාවකින් යුතු බලපෑම පෙන්නුම් කරයි. මේ අතර, 2013 වසරේ මූලික වූ උද්ධමනයෙහි වාර්ෂික සාමාන්‍ය වෙනස කෙරෙහි ආහාර හා මධ්‍යසාර නොවන පාන (සියයට 70.9); නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 8.2); රෙදිපිළි හා පාවහන් (සියයට 5.9); සහ ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තු (සියයට 4.5) යන උප කාණ්ඩයන් ප්‍රධාන වශයෙන් දායක විය.

### දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය

**දේශීයව නිපදවනු ලබන භාණ්ඩ හා සේවාවන්ගේ සමස්ත මිල වෙනස්වීම මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) අවධමනකය, 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ දී අඩු වේගයකින් ඉහළ නැගිණි.** මේ සඳහා කර්මාන්ත සහ සේවා අංශයන්හි අවධමනක අඩු වේගයකින් ඉහළ යාම හේතු විය. ඒ අනුව, ද.දේ.නි. අවධමනකය 2012 වසරේ වූ සියයට 8.9 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 6.7 කින් පමණක් ඉහළ නැගිණි. කර්මාන්ත අංශයේ අවධමනකය 2012 වසරේ දී වාර්තා කළ සියයට 10.7 ක ඉහළ යාමට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 7.3 කින් පමණක් ඉහළ ගියේය. මෙලෙස කර්මාන්ත අංශයේ ඇතුළත් සියලුම උප අංශයන්හි උද්ධමනයේ පහළ යාම් දක්නට ලැබිණි. සේවා අංශයේ අවධමනකය 2012 වසරේ වාර්තා කළ සියයට 9.7 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී සියයට 6.3 කින් ඉහළ ගියේය. සේවා අංශය තුළ, තොග හා සිල්ලර වෙළෙඳාම; හෝටල් හා ආපනශාලා; ප්‍රවාහන හා සන්නිවේදන; බැංකු, රක්ෂණ හා මූර්ත දේපළ; සහ පෞද්ගලික සේවා යන උප අංශයන්හි අවධමනකයන් පෙර වසරට සාපේක්ෂව අඩු වේගයකින් ඉහළ නැගිණි.

**4.5 සංඛ්‍යා සටහන** — **දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය**

(2002=100)

| අංශය | දර්ශකය | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | 2011 | 2012 (අ) | 2013 (ආ) | 2012/2011 (අ) | 2013/2012 (ආ) |
| කෘෂිකර්මාන්ත | 247.3 | 247.5 | 264.7 | 0.1 | 6.9 |
| කර්මාන්ත | 233.2 | 258.1 | 276.9 | 10.7 | 7.3 |
| සේවා | 222.6 | 244.3 | 259.7 | 9.7 | 6.3 |
| **ද.දේ.නි.** | **228.5** | **248.9** | **265.6** | **8.9** | **6.7** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කෙසේ වුවද, නිවාස අයිතිය සහ රාජ්‍ය සේවා යන උප අංශයන්ට අදාළ අවධමනක පෙර වසරට වඩා වැඩි වේගයකින් ඉහළ ගියේය. 2012 වසරේ සියයට 0.1 කින් සුළු වශයෙන් ඉහළ නැගුණු කෘෂිකර්මාන්ත අංශයේ අවධමනකය 2013 වසරේ දී සියයට 6.9 කින් ඉහළ ගියේය. පොල් සහ පශු සම්පත් යන උප අංශයන්හි හැර කෘෂිකර්මාන්ත අංශයේ අනෙකුත් සියලු උප අංශයන්ගේ මිල ගණන්වල වැඩිවීම මෙම ඉහළ යාම සඳහා හේතු විය.

## 4.3 වැටුප්

**පෙර වසර හා සසඳන විට 2013 වසරේ දී රාජ්‍ය හා පෞද්ගලික යන දෙ අංශයෙහිම සේවකයන්ගේ නාමික වැටුප් ඉහළ ගියේය.** වෙළෙඳපොළ බලපෑම් මගින් තීරණය වන අවිධිමත් පෞද්ගලික අංශයෙහි සේවකයන්ගේ නාමික වැටුප්වල ඉහළ යාම සැලකිය යුතු අගයක් ගැනිණි. රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව ඉහළ නංවමින් සිදු කළ සංශෝධනය, වසර තුළ දී ඔවුන්ගේ නාමික වැටුප්වල වැඩිවීමට හේතු විය. අවම වැටුප් ඉහළ නැංවීම හේතුවෙන් විධිමත් පෞද්ගලික අංශයට අයත් කාණ්ඩ තුනෙහිම සේවකයන්ගේ නාමික වැටුප් වැඩි විය. සමස්තයක් ලෙස, 2013 වසරේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් මූර්ත වැටුප් වැඩිවීමක් භුක්ති විඳි අතර, රාජ්‍ය හා විධිමත් පෞද්ගලික අංශයෙහි සේවකයන්ගේ මූර්ත වැටුප් සුළු වශයෙන් පහත වැටිණි.

### රාජ්‍ය අංශයේ වැටුප්

**2013 වසරේ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් දර්ශක සුළු වශයෙන් පහත වැටුණ ද, නාමික වැටුප් ප්‍රමාණ දර්ශක ඉහළ නැගිණි.** 2013 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව රුපියල් 750 කින් ඉහළ නංවමින් සිදු කළ සංශෝධනය සහ ආරම්භක වැටුප් තලය රුපියල් 22,935 ට වඩා

අඩු සේවකයන් සඳහා ගෙවනු ලබන විශ්‍රාම වැටුපට හිමිකම් නොලබන විශේෂ දීමනාව ඉහළ නැංවීම, නාමික වැටුප් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මාසික මූලික ඒකාබද්ධ වැටුප මත ගණනය කරනු ලබන මෙම වැඩි කිරීම සියයට 2.5 බැගින් 2013 මැයි සහ සැප්තැම්බර් මාසයන්හි දී ක්‍රියාත්මක කරන ලදී. විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන්, සුළු සේවකයන් හා රජයේ පාසල් ගුරුවරුන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකවල 2012 වසරේ දී සිදු වූ සියයට 7.0, සියයට 6.7 සහ සියයට 6.9 ක වැඩිවීම් හා සැසඳීමේ දී 2013 වසරේ දී මෙම දර්ශක, පිළිවෙළින් සියයට 4.8, සියයට 5.1 සහ සියයට 4.9 ක් ලෙස ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මධ්‍යම රජයේ සේවකයන්ගේ සමස්ත නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය පෙර වසරේ වාර්තා වූ සියයට 6.9 ක වැඩිවීමට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 5.0 කින් ඉහළ ගියේය. මේ අතර, පෙර වසරේ දී විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන්, සුළු සේවකයන් සහ රජයේ පාසල් ගුරුවරුන්ගේ මූර්ත වැටුප්හි පිළිවෙළින් වාර්තා වූ, සියයට 0.5 ක, සියයට 0.7 ක සහ සියයට 0.6 ක අඩු වීම හා සැසඳීමේ දී 2013 වසරේ දී, පිළිවෙළින් සියයට 2.0 ක, සියයට 1.7 ක සහ සියයට 1.9 ක පහළ යාමක් වාර්තා විය. ඉහත වැටුප් වෙනස්වීම්වල ප්‍රතිඵලයක් ලෙස, මධ්‍යම රජයේ සේවකයන්ගේ සමස්ත මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය 2013 වසරේ දී සියයට 1.9 කින් පහත වැටිණි.

### විධිමත් පෞද්ගලික අංශයේ වැටුප්

**පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයෙහි සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශක මගින් මැන දැක්වෙන නාමික වැටුප්, 2013 වසරේ දී සියයට 5.7 කින් වර්ධනය විය.** මෙහිදී, කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශයන්හි වැටුප් ප්‍රමාණ දර්ශක, පිළිවෙළින් සියයට 32.9 කින් සහ සියයට 21.0 කින් වැඩිවීම 2013 වසරේ දී මෙම ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. උප අංශ බොහොමයක සේවකයන්ගේ අවම වැටුප්වල සිදු වූ සැලකිය යුතු ඉහළ යාම මෙම වැඩිවීම කෙරෙහි දායක විය. කෙසේ වුවද, සියයට 66.0 ක තරම් සැලකිය යුතු බරතැබීමක් සහිත කෘෂිකර්මාන්ත අංශයෙහි අවම වැටුප් ප්‍රමාණ දර්ශකය පෙර වසරෙහි වාර්තා කළ සියයට 29.3 ක වැඩිවීමෙන් අනතුරුව මෙම වසරේ දී නොවෙනස්ව පැවතිණි. විධිමත් පෞද්ගලික අංශයෙහි සමස්ත වැටුප් විචලනය කෙරෙහි කෘෂිකර්මාන්ත අංශය දරන ඉහළ ප්‍රමුඛතාවය පිළිබිඹු කරමින් 2013 වසරේ දී විධිමත් පෞද්ගලික අංශයෙහි සංයුක්ත දර්ශකය සියයට 5.7 කින් පමණක් ඉහළ නැගිණි.

**විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්, විශේෂයෙන්ම, කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශයන්හි සේවකයන් විසින් සැලකිය යුතු මූර්ත වැටුප් ඉහළ යාමක් භුක්තිවිඳින ලදී.** 2012 වසරේ දී සියයට 6.9 ක් බැගින් පහත වැටුණු කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශයන්හි සේවකයන්ගේ මූර්ත වැටුප් 2013 වසරේ දී, පිළිවෙළින් සියයට 24.1 කින් සහ සියයට 13.1 කින් ඉහළ නැගිණි. කෙසේ නමුත්, කෘෂිකර්මාන්ත අංශයේ 2012 වසරේ පැවති සියයට 20.4 ක මූර්ත වැටුප් වර්ධනයට සාපේක්ෂව 2013 වසර තුළ දී එම අංශයේ මූර්ත වැටුප්හි සියයට 6.4 ක අඩු වීමක් වාර්තා විය. කර්මාන්ත හා වාණිජ සහ සේවා යන අංශයන්හි මූර්ත වැටුප් ඉහළ යාමක් 2013 වසරේ දී වාර්තා වුව ද කෘෂිකර්මාන්ත අංශයේ මූර්ත වැටුප් පහළ යාම සහ සමස්ත වැටුප් ප්‍රමාණ

**4.6 සංඛ්‍යා සටහන**

**වැටුප් ප්‍රමාණ දර්ශක**

(1978 දෙසැම්බර් = 100)

| සේවක කාණ්ඩ | දර්ශකය | | | | | | ප්‍රතිශත වෙනස | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නාමික | | | මූර්ත (අ) | | | නාමික | | | මූර්ත (අ) | | |
| | 2011 | 2012 | 2013 (ආ) | 2011 | 2012 | 2013 (ආ) | 2011 | 2012 | 2013 (ආ) | 2011 | 2012 | 2013 (ආ) |
| 1. රජයේ සේවකයන් | | | | | | | | | | | | |
| **මධ්‍යම රජයේ සේවකයන්** | **4,964.5** | **5,304.7** | **5,568.3** | **154.7** | **153.8** | **150.9** | **6.7** | **6.9** | **5.0** | **0.0** | **-0.6** | **-1.9** |
| විධායක නොවන | 4,490.1 | 4,803.6 | 5,035.6 | 139.9 | 139.3 | 136.5 | 6.6 | 7.0 | 4.8 | -0.1 | -0.5 | -2.0 |
| සුළු සේවකයන් | 5,465.1 | 5,831.8 | 6,130.5 | 170.3 | 169.1 | 166.2 | 6.8 | 6.7 | 5.1 | 0.1 | -0.7 | -1.7 |
| **රජයේ පාසල් ගුරුවරුන්** | **3,576.1** | **3,821.8** | **4,011.0** | **111.5** | **110.8** | **108.7** | **7.7** | **6.9** | **4.9** | **0.9** | **-0.6** | **-1.9** |
| 2. පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | | | | | | | |
| **සියලුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන්** | **2,996.1** | **3,662.0** | **3,869.2** | **93.3** | **106.2** | **104.9** | **4.6** | **22.2** | **5.7** | **-2.0** | **13.8** | **-1.2** |
| කෘෂිකර්මාන්තයෙහි නියැලුණු කම්කරුවන් | 3,427.2 | 4,433.0 | 4,435.9 | 106.8 | 128.6 | 120.3 | 3.0 | 29.3 | 0.1 | -3.6 | 20.4 | -6.4 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලුණු කම්කරුවන් | 2,402.1 | 2,402.1 | 3,191.6 | 74.9 | 69.7 | 86.5 | 9.2 | 0.0 | 32.9 | 2.4 | -6.9 | 24.1 |
| සේවා අංශයෙහි කම්කරුවන් | 1,851.8 | 1,851.8 | 2,241.5 | 57.7 | 53.7 | 60.7 | 10.7 | 0.0 | 21.0 | 3.8 | -6.9 | 13.1 |

(අ) මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක, කො.පා.මි.ද. (2006/07=100) පදනම් කොටගෙන ගලපා ඇත.
(ආ) තාවකාලික

මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**4.7 සංඛ්‍යා සටහන**

**අංශය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් (අ)**

| අංශය | වාර්ෂික සාමාන්‍යය (රුපියල්) | | | ප්‍රතිශත වෙනස | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | නාමික | | මූර්ත (ඇ) | |
| | 2011 | 2012 | 2013 (ආ) | 2012 | 2013 (ආ) | 2012 | 2013 (ආ) |
| 1. කෘෂිකර්මාන්ත අංශය | | | | | | | |
| තේ | | | | | | | |
| පුරුෂ | 617 | 691 | 764 | 12.0 | 10.6 | 4.1 | 3.4 |
| ස්ත්‍රී | 438 | 512 | 565 | 16.9 | 10.4 | 8.7 | 3.2 |
| රබර් | | | | | | | |
| පුරුෂ | 658 | 741 | 853 | 12.6 | 15.2 | 4.7 | 7.7 |
| ස්ත්‍රී | 490 | 585 | 652 | 19.4 | 11.4 | 11.0 | 4.3 |
| පොල් (ඇ) | | | | | | | |
| පුරුෂ | 783 | 887 | 997 | 13.3 | 12.3 | 5.4 | 5.2 |
| වී | | | | | | | |
| පුරුෂ | 704 | 787 | 882 | 11.8 | 12.1 | 4.0 | 4.8 |
| ස්ත්‍රී | 530 | 599 | 667 | 13.0 | 11.4 | 5.1 | 4.2 |
| 2. ඉදිකිරීම් අංශය (ඇ) | | | | | | | |
| වඩුකාර්මික | | | | | | | |
| වඩුකාර්මික - පිරිමි | 1,115 | 1,248 | 1,334 | 11.9 | 6.9 | 4.1 | 0.0 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 729 | 824 | 903 | 13.0 | 9.6 | 5.1 | 2.5 |
| පෙදරේරු | | | | | | | |
| පෙදරේරු - පිරිමි | 1,093 | 1,216 | 1,304 | 11.2 | 7.2 | 3.5 | 0.3 |
| පුහුණු හා නුපුහුණු අත්උදව්කරුවන් - පිරිමි | 729 | 823 | 900 | 12.9 | 9.4 | 5.0 | 2.4 |

(අ) වැටුප් විස්තර, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩසටහන මගින් ආවරණය වන මධ්‍යස්ථාන 102 ක මාසික වැටුප් පදනම්කොට ගෙන සකස් කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) මූර්ත වැටුප්, කො.පා.මි.ද. (2006/07=100) පදනම් කොටගෙන ගලපා ඇත.
(ඇ) මෙම අංශවල කාන්තා සහභාගීත්වය අවම මට්ටමක පවතී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දර්ශකයට මෙම අංශයේ පවතින ප්‍රමුඛතාවය හේතු කොට ගෙන විධිමත් පෞද්ගලික අංශයෙහි මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකයේ සමස්ත අගය පෙර වසරට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 1.2 ක සුළු ප්‍රතිශතයකින් පහත වැටිණි.

## අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප්

2013 වසර තුළ දී **අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික සහ මූර්ත සාමාන්‍ය දෛනික වැටුප් විවිධ අනුපාතයන්ගෙන් ඉහළ ගියේය.** මෙම අංශයෙහි නාමික වැටුප්, නිදහස් වෙළෙඳපොළ වාතාවරණය තුළ ශ්‍රම වෙළෙඳපොළෙහි ඉල්ලුම හා සැපයුම වෙනස් වීම මත තීරණය වේ. මෙහිදී, ආර්ථිකය තුළ ශ්‍රමිකයන් බලාපොරොත්තු වන අවම වැටුප් මට්ටම ද තීරණාත්මක සාධකයක් ලෙස ක්‍රියා කරයි. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වා ගෙන යනු ලබන දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ (දීප දත්ත) යටතේ කෘෂිකර්මාන්ත සහ ගොඩනැගිලි ඉදිකිරීම් අංශ ආවරණය කරමින් රැස් කරනු ලබන වැටුප් තොරතුරු මගින් අවිධිමත් අංශයෙහි වැටුප් විචලනයන් විශ්ලේෂණය කෙරේ.

2013 වසරේ දී **අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප්, නාමික වශයෙන්, සියයට 10.2 ක සාමාන්‍ය අනුපාතයකින් ඉහළ ගියේය.** ඒ අනුව, 2013 වසරේ දී කෘෂිකර්මාන්ත සහ ඉදිකිරීම් යන අංශවල සේවකයන්ගේ නාමික වැටුප්, පිළිවෙළින් සියයට 12.0 කින් සහ සියයට 8.0 කින් ඉහළ ගියේය. 2012 වසරේ දී එම අංශයන්හි වැඩිවීම්, පිළිවෙළින් සියයට 13.8 ක් සහ සියයට 12.1 ක් විය. කෘෂිකර්මාන්ත අංශයෙහි රබර්, පොල්, වී සහ තේ යන උප කාණ්ඩයන්හි සාමාන්‍ය දෛනික වැටුප් 2013 වසරේ දී, පිළිවෙළින් සියයට 13.4 කින්, සියයට 12.4 කින්, සියයට 11.7 කින් සහ සියයට 10.5 කින් ඉහළ ගියේය. ඉදිකිරීම් අංශයෙහි, වඩුකාර්මිකයන්ගේ සහ පෙදරේරුවන්ගේ දෛනික වැටුප් 2012 වසරේ පිළිවෙළින් පැවති සියයට 12.4 සහ සියයට 11.9 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී පිළිවෙළින් සියයට 8.0 කින් සහ සියයට 8.1 කින් ඉහළ ගියේය. ඉදිකිරීම් අංශයෙහි ශ්‍රමිකයන් සඳහා පැවති අඛණ්ඩ ශ්‍රම ඉල්ලුම සහ මෙම අංශයේ සේවකයන් විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීම නිසා ශ්‍රම සැපයුමෙහි යම්තාක් දුරට ඇති වූ සංකෝචනය මෙම වැඩිවීම සඳහා යම් බලපෑමක් ඇති කළේය.

අවිධිමත් පෞද්ගලික අංශයෙහි සියලුම උපකාණ්ඩවල සේවකයන්ගේ මූර්ත වැටුප් ද 2013 වසරේ දී ඉහළ ගියේය. ඒ අනුව, රබර්, පොල්, වී සහ තේ යන උප අංශයන්හි සාමාන්‍ය දෛනික මූර්ත වැටුප් 2013 වසරේ දී පිළිවෙළින් සියයට 6.1 කින්, සියයට 5.2 කින්, සියයට 4.5 කින් සහ සියයට 3.4 කින් ඉහළ ගියේය. ඉදිකිරීම් අංශයෙහි වඩු කර්මාන්ත සහ පෙදරේරු යන උප කාණ්ඩවල සේවකයන්ගේ සාමාන්‍ය දෛනික මූර්ත වැටුප්වල ඉහළ යාම පිළිවෙළින් සියයට 1.0 ක් සහ සියයට 1.1 ක් විය. සමස්තයක් ලෙස, කෘෂිකර්මාන්ත සහ ඉදිකිරීම් යන දෙ අංශයෙහි මූර්ත වැටුප් 2012 වසරේ දී පිළිවෙළින් පැවති සියයට 5.8 ක සහ සියයට 4.3 ක ඉහළ යාමට සාපේක්ෂව 2013 වසරේ දී පිළිවෙළින් සියයට 4.8 ක සහ සියයට 1.1 ක ඉහළ යාමක් වාර්තා කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, අවිධිමත් පෞද්ගලික අංශයෙහි සේවකයන්ගේ සමස්ත දෛනික මූර්ත වැටුප් පෙර වසරේ පැවති සියයට 5.1 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 3.1 කින් ඉහළ ගියේය.

## 4.4 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

### ජනගහනය

2013 වසරේ මැදි වසර ජනගහනය මිලියන 20.483 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය පුරුෂයන් මිලියන 9.939 කින් සහ ස්ත්‍රීන් මිලියන 10.544 කින් සමන්විත වේ. මුළු ජනගහනයෙන් මිලියන 5.866 (සියයට 28.6) ක්, එනම්, හතරෙන් එකකට වැඩි ප්‍රමාණයක් බස්නාහිර පළාතේ ජීවත් වන අතර, මිලියන 1.073 (සියයට 5.2) ක ජනගහනයක් වාර්තා කළ උතුරු පළාත අඩුම ජනගහනයක් ඇති පළාත වේ. බස්නාහිර පළාත තුළ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ජනගහනය එක් දිස්ත්‍රික්කයක මිලියන දෙක ඉක්මවන අතර, මෙම දිස්ත්‍රික්ක දෙකෙහි සමස්ත ජනගහනය රටේ මුළු ජනගහනයෙන් සියයට 22.6 කි. කුරුණෑගල, මහනුවර, කළුතර, රත්නපුර සහ ගාල්ල යන එක් එක් දිස්ත්‍රික්කවලින් මිලියනයකට වැඩි ජනගහනයක් වාර්තා වූ අතර, මුලතිව් දිස්ත්‍රික්කයෙන් අවම ජනගහනය වාර්තා විය. මැදි වසර ජනගහනයේ ඉහළ යාමත් සමඟ, ශ්‍රී ලංකාවේ ජනගහන ඝනත්වය, එනම් වර්ග කිලෝ මීටරයක් තුළ ජීවත් වන පුද්ගලයන් සංඛ්‍යාව, 2012 වසරේ දී වාර්තා වූ 324 සිට 2013 වසරේ දී 327 දක්වා වැඩි විය. 2013 වසරේ දී සෑම දිස්ත්‍රික්කයකම ජනගහන ඝනත්වයේ වැඩි වීමක් වාර්තා වූ අතර, ඉහළම ජනගහන ඝනත්වය (3,441) කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. 2013 වසරේ දී වාර්තා වූ රට තුළට සහ රටින් පිටතට සංක්‍රමණය වූ

**4.8 සංඛ්‍යා සටහන** — **දිස්ත්‍රික්ක මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය (අ)(ආ)**

| දිස්ත්‍රික්කය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | ජනගහනය පුද්ගලයින් '000 | ජන ඝනත්වය | ජනගහනය පුද්ගලයින් '000 | ජන ඝනත්වය |
| කොළඹ | 2,316 | 3,425 | 2,326 | 3,441 |
| ගම්පහ | 2,300 | 1,715 | 2,313 | 1,725 |
| කළුතර | 1,220 | 774 | 1,227 | 779 |
| මහනුවර | 1,375 | 717 | 1,384 | 722 |
| මාතලේ | 484 | 248 | 489 | 251 |
| නුවරඑළිය | 710 | 416 | 719 | 421 |
| ගාල්ල | 1,061 | 656 | 1,068 | 660 |
| මාතර | 812 | 639 | 819 | 645 |
| හම්බන්තොට | 599 | 240 | 606 | 243 |
| යාපනය | 585 | 629 | 589 | 634 |
| මන්නාරම | 100 | 53 | 101 | 54 |
| වව්නියාව | 172 | 92 | 174 | 93 |
| මුලතිව් | 92 | 38 | 93 | 39 |
| කිලිනොච්චිය | 114 | 94 | 116 | 96 |
| මඩකලපුව | 527 | 202 | 529 | 203 |
| අම්පාර | 651 | 154 | 658 | 156 |
| ත්‍රිකුණාමලය | 380 | 150 | 384 | 152 |
| කුරුණෑගල | 1,616 | 349 | 1,624 | 351 |
| පුත්තලම | 763 | 265 | 769 | 267 |
| අනුරාධපුරය | 859 | 129 | 868 | 130 |
| පොළොන්නරුව | 404 | 131 | 408 | 133 |
| බදුල්ල | 815 | 288 | 822 | 291 |
| මොණරාගල | 450 | 82 | 456 | 83 |
| රත්නපුරය | 1,086 | 336 | 1,097 | 339 |
| කෑගල්ල | 839 | 498 | 844 | 501 |
| **එකතුව** | **20,328** | **324** | **20,483** | **327** |

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික

(ආ) මැදි වසර ජනගහනය ඇස්තමේන්තු කිරීමේදී, 2012 ජන හා නිවාස සංගණනය, ජනගහනයේ ස්වභාවික වර්ධනය සහ ශුද්ධ සංක්‍රමණ පදනම් කරගෙන ඇත.

සටහන: 2012 මාර්තු 20 වන දාට පසුව උතුරු සහ නැගෙනහිර පළාත්වල, නැවත පදිංචි කිරීම් හේතුවෙන්, ජනගහනයේ දිස්ත්‍රික් මට්ටමින් සිදුවන වෙනස්වීම් මෙම ගණනය කිරීම් සඳහා ඇතුළත්ව නොමැත.

පුද්ගලයන් සංඛ්‍යාව, පිළිවෙළින් මිලියන 2.629 ක් සහ මිලියන 2.677 ක් වූ අතර, ශුද්ධ සංක්‍රමණික අනුපාතය පුද්ගලයන් දහසකට ඍණ 2.33 ක් විය.

### ශ්‍රම බලකාය

වයස අවුරුදු 15 සහ ඊට වැඩි ආර්ථික වශයෙන් සක්‍රිය පුද්ගලයන්ගෙන් සමන්විත වන ශ්‍රම බලකාය, සේවා නියුක්තික හා සේවා වියුක්තික දෙ පිරිසගේම වැඩිවීමක් සනිටුහන් කරමින් 2013 වසරේ දී ඉහළ ගියේය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව 2012 වසරේ දී මිලියන 8.454 ක් වූ ශ්‍රම බලකාය

2013 වසරේ දී මිලියන 8.802 දක්වා සියයට 4.1 කින් ඉහළ ගියේය. වසර තුළ දී සේවා නියුක්ති පුද්ගලයන් සමස්ත ශ්‍රම බලකායෙන් සියයට 95.6 ක් වූ අතර, ඉතිරි සියයට 4.4 සේවා වියුක්ති පුද්ගලයන්ගෙන් සමන්විත විය.

**2013 වසරේ දී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ඉහළ යාම සාධනීය තත්ත්වයක් වනුයේ එය ශ්‍රම වෙළෙඳපොළ තුළ වැටුප් පීඩනය ලිහිල් කිරීමට උපකාරී වන බැවිනි.** වයස අවුරුදු 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය ශ්‍රම බලකායට අනුපාතයක් ලෙස ගණනය කරනු ලබන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය, 2012 වසරේ පැවති සියයට 52.6 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 53.8 දක්වා ඉහළ ගියේය. ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයේ වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2012 වසරේ දී සියයට 32.9 ක් වූ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2013 වසරේ දී සියයට 35.6 දක්වා ඉහළ යාමයි. මෙයට හේතු වූයේ ග්‍රාමීය අංශයේ කාන්තාවන් රැකියා අපේක්ෂාවෙන් ශ්‍රම වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමය. මේ අනුව, ග්‍රාමීය අංශයේ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2012 වසරේ දී පැවති සියයට 33.8 සිට 2013 වසරේ දී සියයට 37.2 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ගෘහ සේවිකාවන් ලෙස විදේශ රැකියා සඳහා පිටත් වූ පිරිස අඩුවීම මෙම හිතකර ප්‍රවණතාවයට හේතු වූවා විය හැකිය. කෙසේ වෙතත්, පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2012 වසරේ දී පැවති සියයට 75.0 සිට 2013 වසරේ දී සියයට 74.9 දක්වා සුළු වශයෙන් අඩු විය. 2012 වසර හා සසඳන විට 2013 වසරේ දී නාගරික පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයේ සිදු වූ අඩුවීම මෙයට හේතු වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2012 වසරේ දී සියයට 48.4 ක් වූ සමස්ත නාගරික ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2013 වසරේ දී සියයට 47.8 දක්වා අඩු වූ අතර, 2012 වසරේ දී සියයට 53.5 ක් වූ සමස්ත ග්‍රාමීය ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2013 වසරේ දී සියයට 55.0 දක්වා වැඩි විය.

### සේවා නියුක්තිය

**රැකියා උත්පාදනයට සහ ආර්ථික වර්ධනයට ඉහළම දායකත්වයක් අඛණ්ඩව ලබා දෙන සේවා අංශයේ රැකියා අවස්ථා වැඩිවීම හේතුවෙන් 2013 වසරේ දී සමස්ත සේවා නියුක්ත පුද්ගලයන් සංඛ්‍යාව වැඩි විය.** 2013 වසරේ දී සේවා නියුක්ත පුද්ගලයන් සංඛ්‍යාව මිලියන 8.418 ක් දක්වා ළඟා වෙමින් සියයට 3.7 කින් වර්ධනය විය. 2012 සහ 2013 කාල පරිච්ඡේද අතරතුර දී ආර්ථිකයේ ප්‍රධාන අංශයන්හි සේවා නියුක්තික පුද්ගල සංයුතියේ සාධනීය වෙනසක් සිදු වී ඇත. කෘෂිකර්මාන්ත අංශය සමස්ත සේවා නියුක්තිය සඳහා දරන දායකත්වය 2012 වසරේ දී පැවති සියයට 31.4 සිට 2013 වසරේ දී සියයට 29.7 දක්වා අඩු විය. කෘෂිකර්මාන්ත අංශයෙහි ශ්‍රමිකයන් වැඩි සංඛ්‍යාවක් නිරත වීම හේතු කොටගෙන එම අංශයේ ශ්‍රම ඵලදායිතාව සාපේක්ෂව අඩු මට්ටමක පවතින තත්ත්වයක් තුළ, කෘෂිකර්මාන්ත අංශයේ ශ්‍රමිකයන් සංඛ්‍යාව අඩුවීම එම අංශයේ ශ්‍රම ඵලදායිතාව කෙරෙහි වූ ධනාත්මක ප්‍රවණතාවයක් ලෙස සැලකිය හැකිය. මේ අතර, සේවා නියුක්තිය සඳහා කර්මාන්ත අංශයේ දායකත්වය 2012 වසරේ දී පැවති සියයට 26.3 සිට 2013 වසරේ දී සියයට 26.2 දක්වා සුළු වශයෙන් අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, පෙර වසරට සාපේක්ෂව 2013 වසරේ දී, ඉදිකිරීම් අංශයෙහි වූ මන්දගාමී වර්ධනයයි. කෙසේ වෙතත්, පතල් හා කැණීම් සහ නිෂ්පාදන කර්මාන්ත යන උප අංශයන්හි සේවා නියුක්තිය ඉහළ ගොස් ඇත. ආර්ථිකයේ ප්‍රමුඛතම අංශය වන සේවා අංශය, 2013 වසරේ දී වැඩි රැකියා ප්‍රමාණයක් ජනිත කිරීමට දායක විය. ඒ අනුව, සෑම උප අංශයකම පාහේ රැකියා අවස්ථා වැඩිවීම හේතු කොටගෙන සේවා අංශයේ සේවා නියුක්තිය 2012 වසරේ දී පැවති සියයට 42.3 සිට 2013 වසරේ දී සියයට 44.1 දක්වා වැඩි විය.

**4.9 සංඛ්‍යා සටහන — කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)**

| ශීර්ෂය | 2012 | 2013 (ආ) | | | | |
|---|---|---|---|---|---|---|
| | | පලමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| **කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000** | **16,081** | **16,356** | **16,358** | **16,361** | **16,365** | **16,360** |
| **ශ්‍රම බලකාය පුද්ගලයන් '000** | **8,454** | **8,862** | **8,866** | **8,809** | **8,671** | **8,802** |
| සේවා නියුක්ත | 8,118 | 8,451 | 8,475 | 8,424 | 8,320 | 8,418 |
| සේවා වියුක්ත | 336 | 411 | 391 | 385 | 351 | 384 |
| **ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඇ)%** | **52.6** | **54.2** | **54.2** | **53.8** | **53.0** | **53.8** |
| පුරුෂ | 75.0 | 75.1 | 75.5 | 74.8 | 74.4 | 74.9 |
| ස්ත්‍රී | 32.9 | 36.2 | 35.6 | 35.8 | 34.7 | 35.6 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) සියලුම දිස්ත්‍රික්කවල වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) තාවකාලික
(ඇ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

**පෙර වසරට සාපේක්ෂව 2013 වසරේ දී පෞද්ගලික අංශයේ සාපේක්ෂ දායකත්වය සුළු වශයෙන් පහත වැටුණ ද, සමස්ත සේවා නියුක්තිය තුළ, සියයට 40.6 ක ඉහළම දායකත්වය එම අංශය මගින් දරනු ලැබිණි.** සමස්ත සේවා නියුක්තිය තුළ සේවා යෝජකයන්ගේ සහ ස්වයං රැකියාවල නියුතුවූවන්ගේ දායකත්වය

**4.10 සංඛ්‍යා සටහන**

### ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය (අ)(ආ)

| අංශය | පුද්ගලයන් '000 | | | | | | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 (ඇ) | | | | | 2012 | 2013 (ඇ) |
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | | |
| **කෘෂිකර්මාන්ත** | **2,551** | **2,385** | **2,668** | **2,418** | **2,547** | **2,504** | **31.4** | **29.7** |
| **කර්මාන්ත** | **2,135** | **2,273** | **2,218** | **2,222** | **2,095** | **2,202** | **26.3** | **26.2** |
| පතල් හා කැණීම් | 87 | 91 | 125 | 99 | 85 | 100 | 1.1 | 1.2 |
| නිෂ්පාදන | 1,432 | 1,563 | 1,482 | 1,560 | 1,452 | 1,514 | 17.6 | 18.0 |
| ඉදිකිරීම්, විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සමීකරණ සැපයුම, ජල එකතු කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීම (ගොවිතැන් කටයුතු හැර) | 616 | 620 | 611 | 563 | 558 | 588 | 7.6 | 7.0 |
| **සේවා** | **3,432** | **3,793** | **3,590** | **3,784** | **3,678** | **3,711** | **42.3** | **44.1** |
| තොග සහ සිල්ලර වෙළෙඳාම, මෝටර් වාහන හා යතුරු පැදි අලුත් වැඩියා කිරිම | 1,122 | 1,180 | 1,182 | 1,153 | 1,089 | 1,151 | 13.8 | 13.7 |
| ප්‍රවාහනය සහ ගබඩා කිරිම් | 497 | 538 | 530 | 467 | 534 | 517 | 6.1 | 6.1 |
| නවාතැන් හා ආහාර සැපයීම | 130 | 172 | 205 | 180 | 195 | 188 | 1.6 | 2.2 |
| තොරතුරු හා සන්නිවේදන ප්‍රකාශන කාර්යයන් | 70 | 60 | 64 | 82 | 45 | 63 | 0.9 | 0.7 |
| මුල්‍ය සහ රක්ෂණ කාර්යයන් | 130 | 171 | 150 | 167 | 124 | 153 | 1.6 | 1.8 |
| වෘත්තිය, විද්‍යාත්මක හා තාක්ෂණ කටයුතු | 57 | 79 | 74 | 71 | 48 | 68 | 0.7 | 0.8 |
| පරිපාලනමය සහ සහාය සේවා කටයුතු | 76 | 113 | 93 | 112 | 110 | 107 | 0.9 | 1.3 |
| රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂණය අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂණය | 567 | 681 | 535 | 631 | 669 | 629 | 7.0 | 7.5 |
| අධ්‍යාපනය | 335 | 305 | 290 | 380 | 344 | 330 | 4.1 | 3.9 |
| මහජන සෞඛ්‍යය සහ සමාජ සේවා කටයුතු | 134 | 136 | 135 | 146 | 147 | 141 | 1.7 | 1.7 |
| වෙනත් (ඈ) | 313 | 359 | 332 | 395 | 371 | 364 | 3.9 | 4.3 |
| **මුළු සේවා නියුක්තිය** | **8,118** | **8,451** | **8,475** | **8,424** | **8,320** | **8,418** | **100.0** | **100.0** |
| ශ්‍රම බලකායේ ප්‍රතිශතය | 96.0 | 95.4 | 95.6 | 95.6 | 95.9 | 95.6 | | |

(අ) ජාත්‍යන්තර ප්‍රමිත කර්මාන්ත වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ආ) සියලුම දිස්ත්‍රික්කවල වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ඇ) තාවකාලික
(ඈ) නිවැසියන්ගේ පරිහරණය සඳහා සම්පාදනය කරනු ලබන සේවා යෝජක කටයුතු, දේපල කාර්යයන්, කලා හා පොදු විනෝදාත්මක කටයුතු සහ ජාත්‍යන්තර සංවිධාන කටයුතු ඇතුළත් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2012 වසරේ පැවති සියයට 34.7 සිට 2013 වසරේ දී සියයට 35.2 දක්වා වැඩි විය. මෙම ප්‍රවණතාව බාහිර පාර්ශ්වයන් විසින් සපයනු ලබන රැකියාවන් මත රඳා පැවැත්ම පහළ යාමේ සළකුණකි. වසර තුළ දී වැටුප් නොලබන පවුලේ සාමාජිකයන්ගේ දායකත්වය ද වැඩි වූ අතර, එය ශ්‍රම බලකාය තුළ ග්‍රාමීය අංශයේ කාන්තා සහභාගිත්වය ඉහළ යාම හේතුවෙන් සිදු වූවා විය හැකිය.

**4.11 සංඛ්‍යා සටහන**

### සේවා නියුක්ති මූලයන් (අ)

ප්‍රතිශතය

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයින් | පෞද්ගලික අංශයේ සේවකයින් | සේව්‍යයන් | ස්වයං රැකියාවන්හි නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2012 | 15.1 | 41.3 | 2.8 | 31.9 | 8.8 | 100.0 |
| **2013 (ආ)** | **15.1** | **40.6** | **3.0** | **32.2** | **9.1** | **100.0** |
| පළමු කාර්තුව | 15.5 | 40.7 | 3.2 | 31.2 | 9.4 | 100.0 |
| දෙවන කාර්තුව | 13.1 | 40.6 | 3.2 | 33.0 | 10.0 | 100.0 |
| තෙවන කාර්තුව | 16.4 | 40.1 | 3.0 | 31.5 | 9.0 | 100.0 |
| සිව්වන කාර්තුව | 15.3 | 41.1 | 2.8 | 32.9 | 7.8 | 100.0 |

(අ) සියලුම දිස්ත්‍රික්කවල වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.12 සංඛ්‍යා සටහන** **රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| අංශය | 2011 | 2012 | 2013 (අ) | ප්‍රතිශත වෙනස 2012/ 2011 | ප්‍රතිශත වෙනස 2013/ 2012 (අ) |
|---|---|---|---|---|---|
| රාජ්‍ය (ආ) | 980,589 | 993,912 | 1,026,728 | 1.4 | 3.3 |
| අර්ධ රාජ්‍ය (ඇ) | 249,199 | 254,728 | 256,189 | 2.2 | 0.6 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,229,788** | **1,248,640** | **1,282,917** | **1.5** | **2.7** |

(අ) තාවකාලික
(ආ) මධ්‍යම රජය, පළාත් පාලන ආයතන හා පළාත් සභා
(ඇ) රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය අධිකාරීන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්ති සමීක්ෂණයට අනුව 2013 වසරේ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තික පුද්ගලයන් සංඛ්‍යාව 1,282,917 දක්වා සියයට 2.7 කින් ඉහළ ගියේය.** මෙම වැඩිවීම රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය යන අංශ දෙක තුළම දැකිය හැකි විය. රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ ඉහළ යාමට වැඩි වශයෙන් දායක වූයේ 2013 වසරේ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ සමස්ත වැඩිවීමෙන් සියයට 95.7 ක් සඳහා දායකත්වය ලබා දුන් රජයේ ආයතනවල සේවා නියුක්තිය සියයට 3.3 කින් වැඩි වීමයි. මෙම වැඩි වීම ප්‍රධාන වශයෙන්ම පළාත් සභා සහ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා සේවකයන් බඳවා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සිදු විය. රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තියට සියයට 20.0 ක දායකත්වයක් සපයන අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ වැඩි වීම සියයට 0.6 කි. සේවක සංඛ්‍යාව මෙන්ම රාජ්‍ය අංශයේ සමස්ත සේවා නියුක්තිය සඳහා වූ දායකත්වය ද සාපේක්ෂව අඩු වුව ද, අර්ධ රාජ්‍ය අංශයේ අනියම් හා කොන්ත්‍රාත් යන පදනම් මත බඳවා ගන්නා ලද ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවක සංඛ්‍යාවේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණි.

## සේවා වියුක්තිය

**රැකියා අපේක්ෂාවෙන් ශ්‍රම වෙළෙඳපොළට නවකයන් පිවිසීමත් සමග 2013 වසරේ සේවා වියුක්ති අනුපාතිකය ඉහළ නැගිණි.** වසරේ ප්‍රථම කාර්තුව තුළ සියයට 4.6 ක්ව පැවති සේවා වියුක්ති අනුපාතිකය, අඩු වීමේ ප්‍රවණතාවක් නිරූපණය කරමින් 2013 වසරේ සිව්වන කාර්තුවේ දී සියයට 4.1 ක් විය. මේ අනුව, පසුගිය වසරේ සියයට 4.0 ක් වූ වාර්ෂික සේවා වියුක්ති අනුපාතිකය මෙම වසර තුළ දී සියයට 4.4 ක් විය. 2012 වසරේ දී මිලියන 0.336 ක් වූ මුළු සේවා වියුක්තික පුද්ගලයන් සංඛ්‍යාව 2013 වසරේ දී මිලියන 0.384 දක්වා වැඩි විය. සේවා නියුක්තිය ඉහළ ගොස් ඇති පසුබිමක, ග්‍රාමීය අංශයේ කාන්තාවන් ශ්‍රම වෙළෙඳපොළට ඇතුලුවීම නිසා ශ්‍රම බලකා සහභාගිත්වය වර්ධනය වීම හේතුවෙන්, මෙම සේවා වියුක්තියේ ඉහළ යාම සිදු වූවා විය හැකිය. 2012 වසරේ දී පිළිවෙළින් සියයට 6.2 ක් සහ 2.9 ක් වූ ස්ත්‍රී සහ පුරුෂ සේවා වියුක්ති අනුපාතිකයන් 2013 වසරේ දී පිළිවෙළින් සියයට 6.6 සහ සියයට 3.2 දක්වා වැඩි විය.

**අ.පො.ස. (සා.පෙළ) සමත් පුද්ගලයන් අතර සේවා වියුක්ති අනුපාතිකය 2012 වසරේ පැවති සියයට 6.0 සිට 2013 වසරේ දී සියයට 5.9 දක්වා සුළු වශයෙන් අඩු විය.** කෙසේ වුවද, 5-9 ශ්‍රේණි දක්වා ඉගෙනුම ලද හා අ.පො.ස. (උ.පෙළ) සහ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලද කාණ්ඩයන්හි සේවා වියුක්ති අනුපාතික වසර තුළ දී ඉහළ නැගිණි. අධ්‍යාපන මට්ටම අනුව ඉහළම සේවා වියුක්ති අනුපාතිකය වන සියයට 8.6 අ.පො.ස. (උ.පෙළ) හා ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් ලද පුද්ගල කාණ්ඩය විසින් වාර්තා කිරීම අවධානයට ලක් වන කරුණකි. ඉහළ අධ්‍යාපනික සුදුසුකම් සහිත පුද්ගලයන් ශ්‍රම වෙළෙඳපොළ වෙත ඇතුළු වීමත් සමග මතු වුණු, අපේක්ෂිත නිපුණතාවයන් සහ ඔවුන් සතු කුසලතාවයන් අතර පවතින නොගැලපීම මෙම ඉහළ සේවා වියුක්ති අනුපාතිකය මගින් පෙන්නුම් කෙරේ. රටෙහි පිළිගත් තෘතීයික අධ්‍යාපන පද්ධතියක් පැවතිය ද මෙම ආයතනවල විෂය මාලාවන් බොහෝ විට නූතන ආර්ථිකයට සරිලන ශිල්පීය දැනුම උත්පාදනය කළ හැකි තාක්ෂණික ක්‍රමවේදයන් ඉලක්ක කර නො ගනී. මෙමගින් පැහැදිලි වනුයේ අධ්‍යාපන හා වෘත්තීය පුහුණු කිරීම් පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවයයි. ක්ෂණිකව ඉගෙනීමට හා අනුගත වීමට හැකි, ස්වාධීන පර්යේෂණ පවත්වමින් තාක්ෂණික නවෝත්පාදනයන් බිහි කිරීමට සමත් වන, සංකීර්ණ වැඩකටයුතුවල වගකීම දැරීමට හැකියාව ඇති, මානව සම්පත් බිහි කිරීමට හැකි වන පරිදි උසස් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය වේ.

**4.2 රූප සටහන** **ශ්‍රම බලකාය සහ සේවා වියුක්තියේ ප්‍රවණතාවන් (2009-2013)**




සටහන : 2011 වසර දක්වා කුටුම්බ ජනගහනයෙන්, වයස අවු. 10 සහ ඊට වැඩි කාණ්ඩය ද 2012 න් පසු වයස අවු. 15 සහ ඊට වැඩි කාණ්ඩය ද නියෝජනය වේ.

**4.13 සංඛ්‍යා සටහන** — **සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) (අ)**

| ශීර්ෂය | 2012 | 2013 (ආ) පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
|---|---|---|---|---|---|---|
| **සමස්ත** | **4.0** | **4.6** | **4.4** | **4.4** | **4.1** | **4.4** |
| **ස්ත්‍රී පුරුෂ අනුව** | | | | | | |
| පුරුෂ | 2.9 | 3.3 | 3.1 | 3.4 | 2.8 | 3.2 |
| ස්ත්‍රී | 6.2 | 7.0 | 6.9 | 6.0 | 6.4 | 6.6 |
| **අධ්‍යාපන මට්ටම අනුව** | | | | | | |
| 4 ශ්‍රේණිය/5 වසර සහ ඊට පහළ | - | - | - | - | - | - |
| 5-9 ශ්‍රේණිය/6-10 වසර | 3.2 | 3.7 | 3.2 | 3.8 | 2.9 | 3.4 |
| අ.පො.ස. (සා.පෙ.) | 6.0 | 6.0 | 5.4 | 6.7 | 5.7 | 5.9 |
| අ.පො.ස. (උ.පෙ.) සහ ඊට ඉහළ | 7.5 | 9.2 | 10.2 | 6.8 | 8.1 | 8.6 |
| **වයස් කාණ්ඩ අනුව** | | | | | | |
| 15-19 | 18.9 | 18.3 | 20.5 | 18.8 | 16.7 | 18.7 |
| 20-24 | 16.8 | 20.7 | 19.9 | 16.6 | 19.7 | 19.2 |
| 25-29 | 6.7 | 7.5 | 6.4 | 8.0 | 8.3 | 7.5 |
| 30-39 | 2.5 | 2.7 | 3.0 | 3.0 | 2.2 | 2.7 |
| 40 සහ ඊට ඉහළ | 0.8 | 1.2 | 0.8 | 1.2 | 0.8 | 1.0 |

(අ) සියලුම දිස්ත්‍රික්කවල වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය පිළිබඳ දත්ත ආවරණය කෙරේ.
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2013 වසරේදී ද තරුණ සේවා වියුක්තිය අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතිණි.** වයස අවුරුදු 15-19 අතර කාණ්ඩයේ සේවා වියුක්තිය පෙර වසරට සාපේක්ෂව 2013 වසරේ දී සුළු වශයෙන් අඩු වුවත් එය සියයට 18.7 ක මට්ටමේ පැවතිණි. වයස අවුරුදු 20-24 කාණ්ඩය 2013 වසරේ දී සියයට 19.2 ක දැඩි සේවා වියුක්තියකින් පෙළුණු අතර, එය 2012 වසරේ පැවති සියයට 16.8 හි සිට සිදු වූ ඉහළ යාමකි. තරුණයන්ගේ අපේක්ෂාවන් හා අවබෝධයන්, ඔවුන්ගේ දැනුම හා නිපුණත්වය සහ වෙළෙඳපොළේ පවතින රැකියා අවස්ථාවන් හේතුවෙන් ජනිත වූ ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම අතර පවතින නොගැලපීම මෙයට හේතු වූවා විය හැකිය. වෘත්තීය හා තාක්ෂණික පුහුණුවීම් සඳහා අවස්ථාවන් අඛණ්ඩව ලබාදීම මෙන්ම ආධුනිකත්ව පුහුණු වැඩසටහන් පැවැත්වීම ද, තරුණ පිරිසට රැකියාවක් සොයා ගැනීමට හැකි අවස්ථා ඉහළ නැංවීමට හේතු වනු ඇත. මීට අමතරව, මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම, කළමනාකරණ නිපුණතා වැඩිදියුණු කිරීම සහ ව්‍යවසායකත්ව හැකියා වර්ධනය කිරීමට මූල්‍ය හා තාක්ෂණික සහයෝගිතාවන් සැපයීම, ආර්ථිකයේ විරැකියා අනුපාතිකය අඩු කරමින් ස්වයං රැකියා හා බහුවිධ රැකියා අවස්ථා බිහි කිරීමට උපකාරී වනු ඇත.

### විදේශ සේවා නියුක්තිය

**රටේ ප්‍රධාන සේවා නියුක්ති මූලාශ්‍රයක් මෙන් ම විදේශ විනිමය ඉපැයීමේ ප්‍රමුඛතම මාර්ගය වන විදේශ රැකියා අවස්ථාවන් 2013 වසරේ දී ද අඛණ්ඩව වැඩි විය.** පසුගිය වසර කිහිපයේ මෙන්ම අඛණ්ඩව ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්වූ විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සේවක සංඛ්‍යාව 2013 වසරේ දී තවදුරටත් ඉහළ ගියේය. බලධාරීන් විසින් පනවන ලද සීමා කිරීම් හේතුවෙන් ගෘහ සේවිකා කාණ්ඩය යටතේ පිටත්ව ගිය පිරිස සැලකිය යුතු ලෙස සියයට 18.6 කින් පහළ ගිය ද, විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාව 2012 වසරේ දී වාර්තා වූ 282,447 ට සාපේක්ෂව 2013 දී 293,105 දක්වා සියයට 3.8 කින් වැඩි විය. වෘත්තිකයන්, මධ්‍යම මට්ටමේ සේවකයන්, ලිපිකරු, පුහුණු ශ්‍රමික සහ නුපුහුණු ශ්‍රමික යන කාණ්ඩ යටතේ සේවා නියුක්තිය සඳහා පිටත්ව ගිය පුද්ගලයන් සංඛ්‍යාවේ සිදු වූ සැලකිය යුතු වර්ධනය මුළු පිටත්ව යාම් ඉහළ නැංවීමට හේතු විය. ඉහළ ශිල්පීය නිපුණතාවක් සහිත කාණ්ඩයේ විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පුද්ගලයන් සංඛ්‍යාව ඉහළ ගිය ද, මුළු පිටත්ව යාම් තුළ එම කාණ්ඩයේ දායකත්වය අර්ධ පුහුණු ශ්‍රමික, නුපුහුණු ශ්‍රමික සහ ගෘහ සේවිකා යන කාණ්ඩයන්ගේ දායකත්වයට වඩා අඩු අගයක් ගත්තේය. 2013 වසරේ දී අර්ධ පුහුණු ශ්‍රමික කාණ්ඩය යටතේ පිටත්ව ගිය පුද්ගලයන් සංඛ්‍යාවේ සුළු අඩු වීමක් වාර්තා විය. 2013 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාව සඳහා අර්ධ පුහුණු ශ්‍රමික කාණ්ඩයේ දායකත්වය සියයට 1.2 ක් පමණක් වන බැවින් සමස්ත පිටත්ව යාම් කෙරෙහි මෙම අඩු වීමේ බලපෑම නොසැලකිය යුතු තරම් වේ.

**ගෘහ සේවිකා කාණ්ඩය යටතේ පිටත්ව ගිය සංඛ්‍යාව මෙන්ම විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාව සඳහා එහි දායකත්වය ද 2013 වසරේ දී සැලකිය යුතු ලෙස පහත වැටිණි.** ශ්‍රී ලංකාවේ විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රම බලකාය ප්‍රධාන වශයෙන්ම ගෘහ සේවිකාවන්ගෙන් සහ අඩු ශිල්පීය නිපුණත්වයකින් යුතු කාණ්ඩයන්ගෙන් සමන්විත වන අතර, භූගෝලීය වශයෙන් මැද පෙරදිග රටවල් කෙරෙහි සංකේන්ද්‍රණය වී ඇත. ආසන්න වශයෙන් මුළු පිටත්ව යාම්වලින් තුනෙන් එකක ප්‍රමාණයක් සහ විදේශ රැකියා සඳහා පිටත් වූ මුළු ස්ත්‍රීන්ගෙන් සියයට 82.1 ක් ගෘහ සේවිකාවන්ය. එසේ වුවද, අදාළ බලධාරීන් විසින් පනවන ලද නියාමනයන්ට දැඩිව අනුගත වීම හේතු කොටගෙන 2013 වසරේ දී ගෘහ සේවිකා කාණ්ඩය යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව යාම්වල අඩු වීමක් වාර්තා විය. විදේශ රැකියා සඳහා කාන්තාවන් පිටත්ව

**4.14 සංඛ්‍යා සටහන**

**විදේශ රැකියා සඳහා පිටත්ව යාම්**

| විදේශ සේවා නියුක්තිය | 2011 | | 2012 (අ) | | 2013 (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| **මුළු විදේශ රැකියා සංඛ්‍යාව** | **262,961** | **100.0** | **282,447** | **100.0** | **293,105** | **100.0** |
| **මූලයන් අනුව** | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයන් | 146,293 | 55.6 | 175,169 | 62.0 | 180,605 | 61.6 |
| වෙනත් | 116,668 | 44.4 | 107,278 | 38.0 | 112,500 | 38.4 |
| **ස්ත්‍රී/පුරුෂ අනුව** | | | | | | |
| පුරුෂ | 136,307 | 51.8 | 144,135 | 51.0 | 175,047 | 59.7 |
| ස්ත්‍රී | 126,654 | 48.2 | 138,312 | 49.0 | 118,058 | 40.3 |
| **ශ්‍රම කාණ්ඩය අනුව** | | | | | | |
| වෘත්තීය | 3,848 | 1.5 | 4,448 | 1.6 | 5,140 | 1.7 |
| මධ්‍යම | 6,136 | 2.3 | 9,280 | 3.3 | 16,508 | 5.6 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත | 9,907 | 3.8 | 16,184 | 5.7 | 26,550 | 9.1 |
| පුහුණු ශ්‍රමික | 67,746 | 25.8 | 67,150 | 23.8 | 73,600 | 25.1 |
| අර්ධ පුහුණු ශ්‍රමික | 4,182 | 1.6 | 3,467 | 1.2 | 3,412 | 1.2 |
| නුපුහුණු ශ්‍රමික | 63,642 | 24.1 | 62,907 | 22.3 | 70,961 | 24.2 |
| ගෘහ සේවිකා | 107,500 | 40.9 | 119,011 | 42.1 | 96,934 | 33.1 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

යාම හේතුවෙන් ලැබෙන ආර්ථික වාසිවලට වඩා රටට අනර්ථකාරී වන සමාජයීය පිරිවැය අවම කිරීම සඳහා වයස අවුරුදු 5 ට අඩු දරුවන් සිටින මව්වරුන් පිටරට රැකියා සඳහා පිටත්ව යාම වැළැක්වීම සහ කාන්තාවන්ගේ විදේශ රැකියා සඳහා පිටත්ව යන අවම වයස් සීමාවන් සංශෝධනය කිරීම මෙම නියාමනයන්ට ඇතුළත් වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2012 වසරේ දී මුළු පිටත්ව යාම්වලින් සියයට 42.1 ක් වූ ගෘහ සේවිකාවන්ගේ සාපේක්ෂ දායකත්වය 2013 වසරේ දී 33.1 දක්වා අඩු විය. 2013 වසර තුළ දී ගෘහ සේවිකාවන්ගෙන් සියයට 98.0 ක් පමණ මැද පෙරදිග රටවලට පිටත්ව ගිය අතර, එයින් සියයට 71.0 කට වඩා පිටත්ව ඇත්තේ සෞදි අරාබිය හා කුවේටය වෙතයි.

**විදේශ රැකියා සඳහා පිටත් වූ පුරුෂයන්ගේ සංඛ්‍යාව සහ එහි සාපේක්ෂ දායකත්වය පසුගිය වසර කිහිපයේම දක්නට ලැබුණු උපනතිය අනුව යමින් 2013 වසරේ දී ද තවදුරටත් ඉහළ ගියේය.** 2013 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය පුරුෂයන්ගේ සංඛ්‍යාව සියයට 21.4 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එයට ප්‍රතිවිරුද්ධව ස්ත්‍රී පිටත්ව යාම් සියයට 14.6 ක අඩු වීමක් වාර්තා කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ස්ත්‍රී සහ පුරුෂ පිටත්වයාම්වල අනුපාතය 2012 වසරේ වූ 49:51 ට සාපේක්ෂව 2013 වසරේ දී 40:60 ක් විය. විදේශ රැකියා සඳහා මුළු පිටත්ව යාම් තුළ පුරුෂ සහ ස්ත්‍රී කාණ්ඩවල සාපේක්ෂ දායකත්වයන් අතර පරතරය පුළුල් වීම මගින්, ස්ත්‍රී ශ්‍රමිකයන්, ගෘහ සේවිකා කාණ්ඩය යටතේ පිටත්වීම් අධෛර්යමත් කරමින්, පුහුණු පිරිමි ශ්‍රමිකයන් විදේශගත වීම ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ බලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද යෝජනාවල ඵලදායිතාව පිළිබිඹු කෙරේ.

**2013 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාවෙන් සියයට 93.9 ක් පිටත්ව ගොස් ඇත්තේ මැද පෙරදිග රටවල් වෙතය.** මෙය 2012 වසරේ දී වූ 263,704 සිට 2013 වසරේ දී 275,324 දක්වා වූ සියයට 4.4 ක ඉහළ යාමකි. මැද පෙරදිග රටවල සේවය කරන ශ්‍රමිකයන් රටේ විදේශ සේවා නියුක්තික ප්‍රේෂණවලින් විශාල ප්‍රමාණයක් සඳහා දායක වේ. විදේශ රැකියා සඳහා පිටත්ව යාම්වලින් සියයට 6.1 ක් මැද පෙරදිග හැර අනෙකුත් රටවල් වෙත ගොස් ඇති අතර, එම ශ්‍රමිකයන් සංඛ්‍යාව 17,781 කි. මැලේසියාව, සීෂෙල්ස්, මුරුසි දිවයින, හොංකොං සහ සිංගප්පූරුව යන රටවල ශ්‍රී ලාංකිකයන් සඳහා වන විදේශ රැකියා අවස්ථාවන්හි ඉහළ යාමක් දක්නට ලැබිණි.

**බලපත්‍රලාභී නියෝජිතයන් සහ අනෙකුත් ක්‍රම හරහා විදේශ රැකියා සඳහා පිටත්ව යාම් සංඛ්‍යාව මෙම වසර තුළ දී ඉහළ ගොස් ඇත.** මුළු පිටත්ව යාම්වලින් බහුතරයක් වන සියයට 61.6 ක් බලපත්‍රලාභී නියෝජිතයන් හරහා පිටත්ව ගොස් ඇති අතර, ඉතිරිය අනෙකුත් මූලාශ්‍ර මගින් සිදු වී ඇත. වයස් කාණ්ඩ අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යාම් සලකා බැලීමේ දී, සමස්ත පිටත්ව යාම් තුළ වැඩිම දායකත්වය වයස අවුරුදු 30-34 කාණ්ඩය විසින් දරන ලද අතර, එය පෙර වසරට සාපේක්ෂව සියයට 3.6 ක වැඩිවීමක් වාර්තා කළේය. මොවුන්ගෙන් බහුතරය ගෘහ සේවිකාවන් විය. පෙර වසරට සාපේක්ෂව පිටත්වීම්වල

**4.15 සංඛ්‍යා සටහන — ගමනාන්තය අනුව විදේශ සේවා සංක්‍රමණ**

| රට | 2012 (අ) | | 2013 (ආ) | | වෙනස (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය (%) | සංඛ්‍යාව | දායකත්වය (%) | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| සෞදි අරාබියාව | 97,964 | 34.7 | 80,836 | 27.6 | -17,088 | -17.5 |
| කටාර් | 57,504 | 20.3 | 80,724 | 27.5 | 23,220 | 40.4 |
| කුවේට් | 44,244 | 15.7 | 42,739 | 14.6 | -1,505 | -3.4 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 38,297 | 13.6 | 48,486 | 16.6 | 10,189 | 26.6 |
| වෙනත් | 44,438 | 15.7 | 40,320 | 13.7 | -4,118 | -9.3 |
| **එකතුව** | **282,447** | **100.0** | **293,105** | **100.0** | **10,658** | **3.8** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

අඩුතම වර්ධනයක් පෙන්නුම් කර ඇත්තේ වයස අවුරුදු 20-24 සහ අවුරුදු 25-29 යන වයස් කාණ්ඩයන්ය. ශ්‍රී ලංකාවේ තරුණ පිරිස අතර වන සේවා වියුක්තිය කෙරෙහි මෙම තත්ත්වය බලපාන්නට ඇත.

**විදේශ රැකියාවන් අපේක්ෂා කරන ශ්‍රී ලාංකිකයන්ගේ අභිමානය, ආරක්ෂාව සහ සමානාත්මතාව තහවුරු කරනු පිණිස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇත.** විදේශගත වන ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ආරක්ෂා කිරීමේ සහ සවිබල ගැන්වීමේ අරමුණෙන් 2013 වසරේ දී සුබසාධන සහ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් අතර රක්ෂණ යෝජනා ක්‍රම, විදේශගත වන අයගේ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය, විදේශයන්හි පීඩාවට පත්ව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මෙරටට ගෙන්වා ගැනීම, වෛද්‍ය පහසුකම් සැපයීම, විදේශ රැකියාවල නියුතුවූවන්, පීඩාවට පත් වූ ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා මූල්‍ය ආධාර සැපයීම,‘රටවිරුවෝ’ සහ ‘රටවිරු රැකවරණ සේවා’ යනාදී වැඩසටහන් ඇතුළත් වේ. පිටත්වීමට පෙර පුහුණුවීම් ලබාදීම සහ කුසලතාවන් වැඩිදියුණු කිරීම මගින් සේවා නියුක්තිකයන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ‘ජාතික වෘත්තීය සුදුසුකම 3 වන මට්ටම’ අනිවාර්යය අවශ්‍යතාවයක් ලෙස හඳුන්වා දෙන ලදී. තවද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් දකුණු කොරියාව බලා පිටත්ව යන ශ්‍රමිකයන්ට පිටත්වීමට පෙර පුහුණුවීම් ලබාදීම ද අඛණ්ඩව සිදු කරන ලදී.

**මව්වරුන් විදේශ රැකියා සඳහා පිටත්වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වන සමාජයීය පිරිවැය අවම කිරීමේ අරමුණෙන් විවිධ ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී.** අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ස්ත්‍රී ශ්‍රමිකයන්ගේ පවුල් පසුබිම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්යය කර ඇත. විවාහක අවිවාහක බව, දරුවන් සිටී නම් ඔවුන්ගේ හා ඔවුන්ගේ භාරකරුවන්ගේ තොරතුරු, ඔවුන්ගේ යැපෙන්නන්ගේ තොරතුරු මෙම වාර්තාවෙහි ඇතුළත් විය යුතුය. සියලුම බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතයන් මෙම අවශ්‍යතාව සපුරාලිය යුතුය. තවද, 2013 වසරේ මැයි මස සිට ගෘහ සේවය සඳහා පිටත්ව යන ස්ත්‍රී ශ්‍රමිකයන් සඳහා එක් එක් රට අනුව අදාළ වන අවම වයස් සීමාව ඉහළ නංවන ලදී. තවදුරටත්, සෞදි අරාබියේ ගෘහ සේවය සඳහා යොදවා ගෙන සිටින කාන්තා ශ්‍රමිකයන්ගේ අවම වැටුප් මට්ටම ද 2013 වසරේ ජූලි මාසයේ සිට ඉහළ නංවන ලදී.

**දිවයින පුරා සිටින ජනතාවට පහසුවෙන් සේවාවන් වෙත පිවිසීමේ හැකියාව ලබාදීමට සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විවිධ ක්‍රමෝපායන් හඳුන්වා දී ඇත.** ප්‍රාදේශීය සහ දිස්ත්‍රික්ක මධ්‍යස්ථාන සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් පත්කිරීම තුළින් සේවක ආරවුල් සමථකරණ යාන්ත්‍රණය විමධ්‍යගත කර ඇත. තවද, බඳවා ගැනීමේ ක්‍රියාවලිය වඩා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම පිණිස රැකියා නියෝජිතයන්ට වෙබ් අඩවි පදනම් කොටගත් බඳවා ගැනීමේ පද්ධතිය (*Web-based Recruitment System*) හඳුන්වා දෙන ලදී. මෙම පියවරයන් මගින් ශ්‍රී ලාංකික සංක්‍රමික ශ්‍රමිකයන් සඳහා විශ්වසනීය විදේශ රැකියා අවස්ථාවන් තහවුරු කර ගැනීමට අපේක්ෂා කෙරේ.

**විදේශ සම්භවයක් සහිත ශ්‍රමිකයන් මෙරටට පැමිණීම ශ්‍රම වෙළෙඳපොළේ මෑතකාලීන ප්‍රවණතාවයකි.** මෙම තත්ත්වය ශ්‍රම වෙළෙඳපොළ තුළ වැටුප් පීඩනය ලිහිල් කිරීමට උපකාරී වන අතර, වෘත්තීමය හා මනාව පුහුණු ආගමනික ශ්‍රමිකයන් මගින් දැනුම සහ තාක්ෂණය ව්‍යාප්ත කිරීමට ඉඩප්‍රස්ථා සපයන සාධනීය ප්‍රවණතාවයකි. කෙසේ වුවද, මෙමගින් මතුවන අවදානම්කාරී තත්ත්වය වනුයේ, මෙම ශ්‍රම ආගමනය සේවා වියුක්තිය ඉහළ නැංවීම කෙරෙහි පීඩනයක් ඇති කළ හැකි වීමයි. කෙසේ වුවද, ශ්‍රම ආගමනය හරහා මතුවන අවස්ථා තුළින් ලැබෙන ඉහළ ප්‍රතිලාභ මගින් මෙම අවාසිදායක තත්ත්වය මගහරවා ගත හැකි වනු ඇත. ඒ සමඟම, මැදි හා දිගුකාලීනව, විවිධ අත්දැකීම් හා අදහස් බෙදාගැනීම සහ වැඩබිම්වල දී නවීන ක්‍රමෝපායන් ඉගෙනීමට අවස්ථා සැලසීම මෙම ප්‍රතිලාභයන්ට ඇතුළත් වේ. දේශීය සහ විදේශීය ශ්‍රමිකයන් අතර සාමාජයීය හා සංස්කෘතික සහයෝගීතාවක් ගොඩනැගීම සඳහා මංපෙත් විවර වීම ද මෙමගින් සිදු වේ.

### කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ

2013 වසරේ දී පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි **සමස්ත වැඩවර්ජන සංඛ්‍යාව, ඒ සඳහා සහභාගි වූ සේවා නියුක්තිකයන් සංඛ්‍යාව සහ ඒ හේතු කොටගෙන අහිමි වූ මිනිස් දින සංඛ්‍යාව ඉහළ ගියේය.** පෞද්ගලික අංශයේ කර්මාන්ත ආශ්‍රිතව සිදු වූ සමස්ත වැඩවර්ජන සංඛ්‍යාව, 2012 වසරේ දී වූ 34 සිට 2013 වසරේ දී 42 දක්වා ඉහළ ගියේය. විශේෂයෙන්ම, වැවිලි අංශයේ කළමනාකාරිත්වය හා සේවකයන් අතර සේවා කොන්දේසි පිළිබඳව එකඟතාවක් ඇති නොවීම මෙම වැඩවර්ජනවලට හේතු වී ඇත. මෙම වැඩවර්ජනවලට සම්බන්ධ වූ පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි සේවකයන් සංඛ්‍යාව 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 12.3 කින් වැඩි වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ දී අහිමි වූ මිනිස් දින ගණන දෙගුණයකටත් වඩා ඉහළ නැගිණි.

**කෙසේ වුවද, සම්බන්ධිත පාර්ශ්වයන් අතර කතිකාවන් හරහා මනා කාර්මික සබඳතාවන් ගොඩනැගීමේ ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේ දී කම්කරු දෙපාර්තමේන්තුව වෙත වාර්තා වූ ආරවුල් ප්‍රමාණය අඩු විය.** ඒ අනුව, 2012 වසරේ දී පැමිණිලි 3,702 ක් වාර්තා වූ අතර, 2013 වසරේ දී සමථකරණය සඳහා ඉදිරිපත් වූ පැමිණිලි සංඛ්‍යාව 3,335 කි. ක්‍රියාමාර්ග කඩිනම් කිරීම හේතුවෙන්, වාර්තා වූ කාර්මික ආරවුල්වලින් සියයට 95.0 ක් පමණ කම්කරු දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී ම නිරවුල් කරන ලදී. සේවා නියුක්තිකයන්, සේවා යෝජකයන් සහ වෘත්තීය සමිති අතර සහයෝගිතාව ඉහළ නංවනු පිණිස කම්කරු දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා සමාජ සංවාද ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

**වැඩ පරිසරය දියුණු කිරීමේ අරමුණෙන් කම්කරු දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා වැඩසටහන් කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී.** සෑම මට්ටමකම සේවකයන්, කළමනාකරණ නිලධාරීන් හා වෘත්තීය සමිති නියෝජිතයන් ඉලක්ක කොටගත් වැඩමුළු සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ආයතනික මට්ටමින් පැවැත්වීම මෙම වැඩසටහන්වලට ඇතුළත් වේ. තවද, 1923 අංක 01 දරන ඉන්දියානු ආගමනික සේවක ආඥා පනතේ කල් ඉකුත් වූ හා වර්තමානයේ දී ක්‍රියාත්මක නොවන ප්‍රතිපාදන හා අතිරේක ප්‍රතිපාදන අවලංගු කිරීම සඳහා අවශ්‍ය සංශෝධන කම්කරු දෙපාර්තමේන්තුව විසින් යෝජනා කොට ඇත.

### ශ්‍රම ඵලදායිතාව

**එක් ශ්‍රමිකයකු සඳහා වන නිෂ්පාදිතය වශයෙන් (2012 වසරේ මිල මත පදනම්ව) මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව 2013 වසරේදී ඉහළ ගිය අතර, ඉහළම වර්ධනය කෘෂිකර්මාන්ත අංශයෙන් වාර්තා විය.** සමස්තයක් වශයෙන්, 2013 වසරේ දී ශ්‍රම ඵලදායිතාව එක් ශ්‍රමිකයකු සඳහා රුපියල් 388,005 කරා ළඟා වෙමින්, සියයට 3.4 කින් ඉහළ ගියේය. කෘෂිකර්මාන්ත අංශයේ ශ්‍රම ඵලදායිතාව සියයට 6.7 කින් ඉහළ ගිය අතර, එය මෙම අංශයේ සේවකයන් සංඛ්‍යාව පහළ බැසීමේ හා මූර්ත නිෂ්පාදනයේ වර්ධනයෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

**4.16 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයේ කර්මාන්තවල වැඩ වර්ජන**

| වර්ෂය | වතු අංශය | | | වෙනත් අංශ (අ) | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන | වැඩ වර්ජන සංඛ්‍යාව | සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස් දින ගණන |
| 2010 | 9 | 3,185 | 23,037 | 6 | 1,923 | 2,034 | 15 | 5,108 | 25,071 |
| 2011 | 19 | 6,692 | 23,513 | 8 | 3,807 | 15,673 | 27 | 11,039 | 39,186 |
| **2012** | **14** | **4,278** | **25,043** | **20** | **5,626** | **10,774** | **34** | **9,904** | **35,817** |
| පළමු කාර්තුව | 8 | 1,991 | 5,743 | 12 | 4,330 | 5,959 | 20 | 6,321 | 11,702 |
| දෙවන කාර්තුව | 2 | 822 | 13,208 | 2 | 360 | 856 | 4 | 1182 | 14,064 |
| තෙවන කාර්තුව | 1 | 835 | 1,670 | 2 | 287 | 2,541 | 3 | 1,122 | 4,211 |
| සිව්වන කාර්තුව | 3 | 630 | 4,422 | 4 | 649 | 1,418 | 7 | 1,279 | 5,840 |
| **2013 (ආ)** | **21** | **5,031** | **41,669** | **21** | **6,088** | **38,754** | **42** | **11,119** | **80,423** |
| පළමු කාර්තුව | 4 | 416 | 1,046 | 7 | 2,505 | 21,381 | 11 | 2,921 | 22,427 |
| දෙවන කාර්තුව | 7 | 2,436 | 29,112 | 5 | 1,893 | 7,537 | 12 | 4,329 | 36,649 |
| තෙවන කාර්තුව | 5 | 1,490 | 9,134 | 2 | 498 | 3,208 | 7 | 1,988 | 12,342 |
| සිව්වන කාර්තුව | 5 | 689 | 2,377 | 7 | 1,192 | 6,628 | 12 | 1,881 | 9,005 |

(අ) අර්ධ රාජ්‍ය සහ අනෙකුත් පෞද්ගලික ආයතන ඇතුළත් වේ.
(ආ) තාවකාලික

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව

**4.17 සංඛ්‍යා සටහන — ප්‍රධාන ආර්ථික අංශ අනුව ශ්‍රම ඵලදායිතාව**

| ශීර්ෂය | 2012 | 2013 (අ) |
|---|---|---|
| ස්ථාවර (2002) මිල අනුව ද.දේ.නි. (රුපියල් මිලියන) | **3,045,288** | **3,266,099** |
| කෘෂිකර්මාන්ත | 336,817 | 352,641 |
| කර්මාන්ත | 925,152 | 1,016,886 |
| සේවා | 1,783,318 | 1,896,572 |
| ශ්‍රම ඵලදායීතාව සේවා නියුක්ත එක් පුද්ගලයකු සඳහා රුපියල් '000 (ආ) | **375.1** | **388.0** |
| කෘෂිකර්මාන්ත | 132.0 | 140.8 |
| කර්මාන්ත | 433.3 | 461.8 |
| සේවා | 519.6 | 511.0 |

(අ) තාවකාලික
(ආ) සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දත්ත ඇතුළත් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සමස්ත ඵලදායිතා වර්ධනය සඳහා ඉහළම දායකත්වය කර්මාන්ත අංශයෙන් ලැබිණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2013 වසරේ දී කර්මාන්ත අංශයේ ශ්‍රම ඵලදායිතාව සියයට 6.6 කින් ඉහළ ගියේය. සේවා අංශයේ මූර්ත නිෂ්පාදිතය 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ දී වැඩි වර්ධන අනුපාතිකයකින් ඉහළ ගිය ද, එම අංශයට නවක සේවකයන් එක්වීම හේතුවෙන් 2013 වසරේ දී ශ්‍රම ඵඩලදායිතාව සියයට 1.7 කින් පහත වැටිණි.

**තිරසාර වර්ධනයක් ළඟාකර ගැනීම සඳහා ආර්ථිකයේ සෑම අංශයකම ඵලදායිතාව ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වේ.** මෙහිදී, ඵලදායිතාව ඉහළ නැංවීම මගින් සමස්ත නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා අදාළ ආයතන විසින් ක්‍රියාමාර්ග ගණනාවක් වසර තුළ දී ගනු ලැබිණි. විදුලි සංදේශ, මහා මාර්ග පද්ධති, වරායන් සහ ගුවන් තොටුපොළ ඉදිකිරීම හා නවීකරණය ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් තවදුරටත් ඵලදායිතා වර්ධනය සඳහා මූලික පදනම සම්පාදනය කර ඇත. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන මගින් ඵලදායිතා වර්ධන වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කෙරිණි. කයිසන් (Kaizen), හරිත ඵලදායිතාව (Green Productivity) සහ තත්ත්ව කව (Quality Circles) ආදිය ඇතුළත් විවිධ ඵලදායිතා සංකල්ප මෙම වැඩසටහන් මගින් ආවරණය කෙරිණි. රටෙහි මානව සම්පත් භාවිතය ඉහළ නැංවීමේ අරමුණ සහිතව, මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව විසින් රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා වෘත්තීය මාර්ගෝපදේශනය අරමුණු කරගත් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ ව්‍යවසාය සංවර්ධනය, රැකියා වෙළෙඳපොළ පුළුල් කිරීම සහ රැකියාවක යෙදවිය හැකි බව වර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන් රැසක් විය. කෘෂිකර්මාන්ත අංශයේ සිට අනෙකුත් අංශ කරා ශ්‍රම බලකාය නිසි පරිදි යොමු කිරීම තුළින් කෘෂිකර්මාන්ත අංශයේ ශ්‍රම ඵලදායිතාව තවදුරටත් වර්ධනය කරගත හැකිවනු ඇත. කෘෂිකර්මාන්ත අංශය ඉහළ ඵලදායිතා වර්ධන වේගයක් වාර්තා කළ ද, එම අංශයෙහි ශ්‍රම ඵලදායිතා මට්ටම ආර්ථිකයේ අනෙකුත් ප්‍රධාන අංශ දෙකට වඩා සැලකිය යුතු ලෙස අඩුය. මේ වනවිට කෘෂිකර්මාන්ත අංශය, මුළු සේවා නියුක්ත පුද්ගල සංඛ්‍යාව සැලකීමේ දී දෙවැනි විශාලතම අංශය වුවද, සමස්ත දළ දේශීය නිෂ්පාදිතය සඳහා එහි දායකත්වය සියයට 10.8 ක් පමණක් වීම ශ්‍රම ඵලදායිතාවයේ අඩු මට්ටම පිළිබිඹු කරයි. සම්පත් භාවිතයේ පවතින මෙම ව්‍යුහාත්මක දුර්වලතා මගහරවා ගැනීම සඳහා යාන්ත්‍රීකරණය ඉහළ නැංවීම සහ නිසි අධ්‍යාපනය හා පුහුණුව තුළින් කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයේ අමතර ශ්‍රම බලකාය කර්මාන්ත සහ සේවා යන වඩා ඵලදායී අංශ වෙත යොමු කිරීම සිදු කළ යුතුය. මේ සඳහා යහපත් පරිචයන් සහ ශිල්පීය ක්‍රම හඳුන්වාදීම පිණිස කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය මගින් තොරතුරු සහ දැනුම බෙදාදීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් මගින් පරිසරය ද රැක ගනිමින්, උසස් ප්‍රමිතියේ බීජ, පොහොර, යන්ත්‍රසූත්‍ර සහ කෘමිනාශක ඵලදායී ලෙස භාවිතය පිළිබඳ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත. ජල සම්පාදනය, ජල කළමනාකරණය, ඉඩම් භාවිතය සහ පාංශු සංරක්ෂණය පිළිබඳ ප්‍රතිපත්ති ද මේ අතර වෙයි. කෘෂිකර්මාන්ත අංශයේ නව ශිල්ප ක්‍රම පිළිබඳ වූ පර්යේෂණ හා අධ්‍යාපන වැඩසටහන් ද එම ක්ෂේත්‍රයේ ඵලදායිතාව වර්ධනය කෙරෙහි ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වුවද, අස්වනු නෙලීමෙන් පසුව නිෂ්පාදනවලට සිදුවන හානි අවම කර ගැනීම පිළිබඳ ගැටළු රැසක් පවතී. ඵලදායී ප්‍රවාහන හා ගබඩා ක්‍රම, ගොවිපළේදීම කෘෂිකාර්මික අස්වනුවලට අගය එකතු කිරීම සහ නිපැයුම්වල වෙළෙඳාම ප්‍රවර්ධනය සඳහා වූ අලෙවිකරණ ක්‍රමවේදයන්, එම කෘෂි නිෂ්පාදනවලට සිදුවන හානි අවම කර ගනිමින් නාස්තිය අවම කර ගැනීමට උපකාරී වනු ඇත.

**දියුණු සන්නිවේදන තාක්ෂණික ක්‍රම තවදුරටත් උපයෝගී කර ගැනීම සහ පුහුණු ශ්‍රම බලකා වර්ධනයත් සමඟ සේවා අංශයේ ඵලදායිතාව තවදුරටත් ඉහළ නැංවීම සඳහා ඉඩකඩ පවතී.** වත්මන් ගෝලීය ආර්ථික වාතාවරණය සහ දේශීයව, පංචවිධ කේන්ද්‍රීය උපායමාර්ගික වැඩපිළිවෙළ (5+1 Hub Strategy) මගින්, සේවා අංශයේ ප්‍රගතිය වැඩි කර ගනිමින්, ජාත්‍යන්තර ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීමට අවස්ථාව පවතී. ශ්‍රම බලකායේ දැනුම හා කුසලතා නොකඩවා ඉහළ නැංවීමට සමගාමීව ජාත්‍යන්තර ඉල්ලුමට අනුව සුදුසු පරිදි ක්‍රියාවලීන් ප්‍රමිතිකරණය කිරීමට හැකි වුවහොත්, සේවා අංශයේ ඵලදායිතාව සහ වර්ධනය තවදුරටත් ඉහළ නංවා ගත හැකි වනු ඇත. විදේශීය ආයෝජන සහ විදේශීය ශ්‍රම සංක්‍රමණ මගින් දැනුම හා ශිල්පීය ක්‍රම බෙදා ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන, ආර්ථිකයේ සෑම අංශයකම ඵලදායිතා මට්ටම් ඉහළ නැංවීමට උපකාරී වනු ඇත.